# THE WHITE HACKLE

JOURNAL OF THE SRI LANKA LIGHT

ශ්‍රී ලංකා පාබල හමු



April 2002

2002 ජනවාරි මස 11 වන දින ශ්‍රීලපාහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේ පැවති රකෂණ වන්දි ප්‍රධානෝත්සවයේ ප්‍රධාන අමුත්තා ලෙස පැමිණි මේජර් ජෙනරාල් පීඩීඩබ් ජයසුන්දර ආර්ඩබ්පී,ආර්එස්පී,පීඑස්සී හට පිරිනමන ලද සම්මාන මුරයේ/පෙලපාලියේ විශේෂ අවස්ථා...



සම්මාන මුරයේ උත්තමාචාරය...



සම්මාන මුරය පරීක්ෂා කරමින්.....



සම්මාන පෙලපාලියේ ගෞරයනීය උත්තමාචාරය පිලිගනිමින්.....



සම්මාන පෙලපාලියේ ගෞරයනීය උත්තමාචාරය.....





ස[illegible] පරීක්ෂා කරමින්.....

# THE WHITE HACKLE

APRIL 2002, VOLUME 09 NO. 02 32ND ISSUE



කායවර්ධන

ක්‍රීඩාවේ නියැලෙමින්

ඉදිරියට යන පාබල

සෙබළෙක්

පිටුව 6



අණදෙන නිලධාරී
තනතුර භාරදීම /
භාරගැනීම
රෙජිමුඛ ශ්‍රීලපාහ

පිටුව 14



රෙම ශ්‍රීලපාහ තූර්ය
වාදක කණ්ඩායම

පිටුව 16

## Headlines


ගමන් නියෝගයක් නැතිව
1 ශ්‍රීලපාහ කඳවුරට රපෝර්තු
කළ අමුත්තා 3

වීර වික්‍රම විභූෂණය 4

විරුව අපි ඔබව සිහිපත් කලෙමු 5

කතරගම වන්දනා චාරිකාව 7

කණ්ඩායම් සාමූහික පුහුණුවීම්
- 10 ශ්‍රීලපාහ 8

ඉතිහාසය තුළින් වර්ණවත් වන
2(සෙවි) ශ්‍රීලපාහ 12

මධ්‍යස්ථාන සේනාවිධායකගේ
රෙජ් බත්/ සැර තිවස්ත සංචාරය 15

තිවත් දකින්නට මේ පිංකම ඇති 18

මොරටු පුරවරයෙන් වීර සෙබල
සත්කාරය 19

තල් අරඹේ සිට 32


**කවරයේ කථාව :**
රෙම ශ්‍රීලපාහ සංචාරය කළ රාජ්‍ය ආරක්ෂක අමාත්‍ය ගරු තිලක් මාරපන මැතිතුමා කණ්ඩුල ඇතුන්ට පළතුරු ලබා දීම

PRINT WELL - 244 DAM STREET, COLOMBO 12.

# Feedback

## අදහස් උදහස් හා විවේචන

# Readers Please Write in

The WHITE HACKLE, the Voice of the Sri Lanka Light Infantry Regiment is now firmly established. It has reached maturity. This is the Thirty Second issue.

We should not rest on our laurels. Targets have to be set. Greater goals achieved. The success of WHITE HACKLE depends on combined efforts. Everyone has his contribution to make, and every contribution is most welcome. What is valued is our making the attempt, then we can surely do our bit. Express your thoughts, ideas, opinions, and criticisms, hopes and fears through 'THE WHITE HACKLE' the journal of the oldest and proudest Regiment of them all. If you have much to say about your Battalion's experience go ahead and write in to the 'WHITE HACKLE'. We are willing to accept and use what is of a standard, like sketches, stories and poems, whatever comes from your thoughts and your pen.

Our Motto is "Ich Dien" "I Serve". Let 'WHITE HACKLE' be a way to serve each other, our regiment and our country with our banner flying high as it always will.

Wishing you all the very best.

*Editor in Chief*

## හිතවත් පාඨකය, කරුණාකර ඔබගේ අදහස් අප වෙත එවන්න

ශ්‍රී ලංකා පාබල හමුදවේ හඬ ඉතා උසස් ලෙස නංවන 'වයිට් හැකල්' සහරාවේ තිස් දෙවන කලාපයත් සමග එහි ළදරු අවධිය අවසන්කල අප ඉතා විශ්වාස වන්තව ඉදිරියට පිය ඔසවමින් පරිනත භාවයට පත් වෙමින් සිටින්නෙමු. රෝම අධිරාජ්‍යය ඉතා කෙටි කලකින් ගොඩ නැගුවක් නොවන අතර අපි ද පියවරින් පියවර ඉතා විශ්වාසවන්තව ස්ථිර අඩිතාලමක් සඳහා ඉදිරියට ගමන් කරමින් සිටින්නෙමු.

එනමුත් අප දැනට ලබා ඇති ප්‍රගතියෙන් සෑහීමකට පත්විය නොහැක. තව ඉදිරියට යා යුතු මග බොහෝ ය. එය දුෂ්කර ද නැතහොත් බාධාවකින් තොර වන්නේ දැයි තීරණය වන්නේ ඔබගෙන් ලැබෙන මහඟු සහයෝගය මතය. 'වයිට් හැකල්' සහරාවේ ප්‍රගතිය සඳහා අප සියලු දෙනාටම ඉටු කිරීමට ඇති කාර්යභාරය ඉමහත් ය. ඔබගෙන් සුළුවෙන් හෝ අප වෙත ලැබෙන සහයෝගය සෑම අවස්ථාවකම අපි අගයමු. අවශ්‍ය වන්නේ ඔබගේ උත්සාහයයි. එයින් අප වඩාත් ධෛර්යමත් වන අතර අපගේ කාර්යය නිසි අයුරු ඉටු කිරීමට අවශ්‍ය පන්නරය ලබන්නෙමු.

මෙම සහරාව පිළිබඳ හා එහි ලිපි රචනා පිළිබඳ ඔබගේ අවංක අදහස් හා විවේචන අප වෙත එවන්න. එය වයිට් හැකල් සහරාවේ ඉදිරි ගමනට මහඟු අත්වැලකි. 'වයිට් හැකල් සහරාව' ශ්‍රී ලංකා යුධ හමුදවේ අභිමානවත් ඉතිහාසයට හිමිකම් කියන ප්‍රෞඪතම රෙජිමේන්තුවක් වන ශ්‍රී ලංකා පාබල හමුදව මගින් ත්‍රෛයි මාසිකව පල කරනු ලබයි.

මෙම පෞඪ රෙජිමේන්තුවේ සාමාජිකයෙකු වී සිටීම ගැන ඔබ ඔබ ගැනම ආඩම්බර විය යුතු ය. මෙම රෙජිමේන්තුව අනාධිමත් කලක් රැකගත් විලසට අප විසින් එය ඉදිරියට ද සුරැකිය යුතුය.

ඔබ බලඇණිවල යම් විශේෂ සිදුවීම් හා අවස්ථා පිළිබඳ ඔබ හට පැවසීමට ඇත්නම් 'වයිට් හැකල්' සහරාව වෙත ලියන්න. ඔබගේ ලිපි ඉතා උසස් තත්වයක ඇතැයි අප විශ්වාස කරන අතර එම ලිපි 'වයිට් හැකල්' සහරාවේ පල කිරීමට අප පුල පුලා බලා සිටින්නෙමු. එමෙන්ම ඔබගේ උසස් කවි සංකල්පනා හා සිතුවම් සඳහා ද මෙම සහරාවේ ඉඩ ප්‍රස්ථාව ඇත.

අපගේ ආදර්ශ පාඨය වන 'සේවය කරමි' මත පිහිටා අප එකිනෙකාට, රෙජිමේන්තුවට, හමුදවට හා රටට සේවය කරමු. අපගේ පාබල හමුද ධජය ඉතා විශ්වාසවන්තව, අභිමානයෙන්, ඉතා ඉහලින් ලෙලදුන් විලසටම, තව දුරටත් ලෙලදීමට අවස්ථාව උද කර දෙමු.

ප්‍රධාන කර්තෘ

**THE WHITE HACKLE** is for Members of the SLLI, their families, Ex-Servicemen of SLLI and as a whole for the entire Army. It will be extended even to all Sri Lankans.

We invite readers' views. Under 150 words; A post card will do - and include your name, rank and address. We will withhold your name if you so desire and may condense your views because of space. We cannot publish or answer every one, but we will use representative views. Send your letters to:

**Feedback,**
The White Hackle,
RHQ SLLI, Army Cantonment,
Panagoda, Homagama.


THE WHITE HACKLE

**SRI LANKA LIGHT INFANTRY MAGAZINE**

**Col of the Regt.**
Maj Gen SHS Kottegoda WWV, RWP, RSP,USP, ndc

**Centre Commandant**
Col R.M.D. Rathnayaka RWP, RSP, psc

*The White Hackle*, Staff

Editor-in Chief - Col RMD Rathnayaka RWP, RSP, psc

Assistant Editor - Lt Col S C Karunarathne RSP, SLLI

Associate Editors - Lt Col C Wimalasiri SLLI
Lt Col SWMTB Hulugalle SLLI
Capt.THS Aravinda, RWP, RSP SLLI

Chief Consultant - Maj Gen. SHS Kottegoda WWV, RWP, RSP, USP, ndc

Honorary Consultants - Maj Gen HV Athukorale VSV, psc, FBIM (Rtd), (Reg Force)
Brig AER Abeysinghe KSV (Rtd) (Vol Force)

Publisher - Regimental Centre
Sri Lanka Light Infantry.

*The White Hackle* is published quarterly under the supervision of the Regimental Centre Commandant to provide the Regiment with information on people, policies, operations, technical developments, views, opinions and ideas about the Sri Lanka Light Infantry.
- Manuscripts of interest to the Regiment are invited.
- Direct Communication is authorized to Editor, or Asst Editor, The White Hackle, Regimental Centre, Army Cantonment, Panagoda, Homagama. Phone 855204 or 437073 - 4 Extn. 4340 or 4341.
- Individual paid subscriptions are available through the Regimental Adjutant, Sri Lanka Light Infantry.
- Publication of this periodical is authorized by the Dte of PA, Army HQ CBO by letter No. A/275/27 of 16 Mar '94.
- Use of funds for printing this publication has been approved by the Regimental Commander on 30th Aug 1993 at the Regimental Conference held at Welioya.

# විරුව අපි ඔබ සිහිපත් කළෙමු

ශ්‍රී·ලංකා පාබල හමුද රෙජිමේන්තුවේ උදරතර විරුවන් ලෙසින් තම මව්බිමේ ඒකීය භාවය වෙනුවෙන් මව්පිය / අඹුදරුවන්ගෙන් වෙන් වී අව්ව වැස්ස නොතකා අනාගත පරපුරට නිවහල් දේශයක් උරුම කිරීමේ අරමුණින් දිවිහිමියෙන් සටන්කළ විරුවන් සැමරීමේ තවත් එක් සුවිශේෂ දිනයක් වෙනුවෙන් වෙහෙස මහන්සිවීමේ භාග්‍ය අප වෙත උදවිය. 2002 ජනවාරි මස 11 වන දින උදසන හිරු කුමරුන් මිහිතලය සිප ගැනීමටත් පෙර පනාගොඩ යුධ හමුද ජනපයේ සර්ව ආගමික මධ්‍යස්ථානයේ එම සුවිශේෂ කටයුතු වෙනුවෙන් බොහෝ වැඩ කටයුතු සූදනම් වෙමින් පැවතිණ. එනම් මිනිසකු ලෙසින් මෙලොව ඉපිද කළහැකි වූ උදර මෙහෙවරක් මව් භූමිය වෙනුවෙන් ඉටු කර තම තුරුණු විය කැප කරමින් ආදරණීය දෙමව්පිය දූ දරුවන්ගේ හා ඥතිමිත්‍රාදීන්ගෙන් සඳහටම සමුගත් පාබළ හමුද රණවිරුවන්ගේ පවුල් 90 ක් වෙනුවෙන් රු. 100000.00 ක සමූහ රක්‍ෂණ වන්දි මුදල් ප්‍රධානය හා ඔවුන් සිහිකිරීමේ සත් ක්‍රියාවේ වැඩ කටයුතු 2002.01.11 වන දින උදසන 1000 පැයට ආරම්භ කිරීමට යෙදුණේ ය.

රෙම ශ්‍රීලපාභ සේනාවිධායක කර්නල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී ගේ හා මාති 1 (පාලන) මේජර් එස්කේජීඑන්බී ඇහැලමල්පේ ආර්එස්පී ශ්‍රීලපාභ ගේ පූර්ණ අධීක්‍ෂණය යටතේ ශ්‍රී ලංකා පාබල හමුද කාන්තා සංගමයේ සහභාගීත්වයෙන් මෙම සත් ක්‍රියාවේ කටයුතු සංවිධානය වන ලදී. ශ්‍රීලපාභ රෙජිමේන්තුවට අයත් නිත්‍ය හා ස්වේච්ඡා ඒකක සමග රාජකාරි කළ රණවිරුවන්ගේ පවුල් 90 ක සාමාජිකයින් 148 දෙනෙකු වෙනුවෙන් මෙහි දී සමූහ රක්‍ෂණ වන්දි මුදල් ප්‍රධානය කිරීමට නියමිත ව තිබූ අතර, මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් මේජර් ජෙනරාල් ජීබීඩබ් ජයසුන්දර ආර්ඩබ්පී, ආර්එස්පී සහභාගි විය.

ප්‍රධාන අමුත්තා උත්සව භූමිය වෙත පැමිණීමෙන් පසු සර්ව ආගමික මධ්‍යස්ථානයේ තනා ඇති රණවිරු ස්මාරකය අසලදී දේශයෙන් සමුගත් සහෝදර රණවිරුවන් සිහිකර උත්තමාචාර පිරිනමා ඔවුන් වෙනුවෙන් රණවිරු ඥතීන් දෙදෙනෙක් හා ප්‍රධාන අමුත්තා විසින් මල්කළඹ තැන්පත්කර ජාතියේ ප්‍රණාමය පුදකර සිටීමෙන් උත්සව කටයුතු ආරම්භ විය. පැමිණි සිටි සියළු රණවිරු රක්‍ෂණ ලාභීන් උත්සව ශාලාවේ නියමිත ස්ථානයන් හි අසුන් ගැනීමෙන් පසු සභාව ඇමතූ මේජර් ජෙනරාල් ජීබීඩබ් ජයසුන්දර ආර්ඩබ්පී ආර්එස්පී පවතින රාජකාරි තත්ත්වය මත නිතර ඔබ හා එක්වීමට අවස්ථාව නොලැබුනත් මෙවැනි කටයුත්තක දී හෝ රණවිරු ඥතීන් හා එක්වී කටයුතු කිරීමට ලැබීම භාග්‍යයක් බවත්, ලැබෙන සෑම අවස්ථාවකදීම රණවිරු ඥතීන් හට උපකාර කිරීමට බැඳී සිටින බවත් පවසන ලදී. එතුමන් විසින් වැඩිදුරටත් කතා කරමින් කියා සිටියේ තම පුතනුවන් / ස්වාමියා / සොහොයුරා පියාණන් අහිමිවීම දුකක් කණගාටුවක් බවත්, එහෙත් ඔහු අහිමි වූයේ සමාජයට බරක් වූ අයෙකු ලෙස නොව මුළු මහත් දේශයක පිදුම් ලැබූ විරුවෙකු ලෙසින් වීම නිසා අඩම්බර වියයුතු කරුණක් බවයි. සෑම අවස්ථාවක දීම ඔබ සැම තනි නොකරන බවත්, ඔබ සැම සුරැකීම යුතුකමක් හා වගකීමක් වන බැවින් ඒ සඳහා කැපවී සිටින බවත්, පවසමින් සියලු දෙනා හට සෞභාග්‍යමත් අනාගතයක් වේවායි ආශිර්වාද කරමින් කථාව අවසන් කරන ලදී.

පියවරෙන් පියවර කාලය ගෙවෙද්දී රක්‍ෂණ ලාභීන් එකිනෙකාගේ කඳුලු පිරි දෙනෙතින් යුතුව තම පුතු/ස්වාමියා වෙනුවෙන් හිමි වූ එම වන්දි මුදල් ප්‍රේෂණපත් ලබාගනිද්දී මුළු සභා ගර්භයම හැඟිම්බර අවස්ථාවකට මුහුණ දෙන ලදී. විටෙක සිය පුතුනුවන් වෙනුවෙන් ශෝක වූ මහලු පියානන් හට එම අවස්ථාව සඳහා සහභාගී වීමට පවා අසීරු කරුණක් බවට සිදුවිය. පැමිණ සිටි ඥතීන් බොහෝ දෙනෙකු ඒ මොහොතේ කඳුලු පිරි දෙනෙතින් සිටීම බලාසිටි සැමගේ සිත සසල කරවන්නට ඇතැයි සිතමි. මේජර් ජෙනරාල් ජීබීඩබ් ජයසුන්දර ආර්ඩබ්පී, ආර්එස්පී විසින් එම චෙක්පත් පිරිනමද්දී ශ්‍රී ලංකා පාබල හමුද කාන්තා සංගමයේ සභාපතිනිය හා එම සාමාජිකාවන් ද සබාගැබේ සිට මෙම මහඟු අවස්ථාවට සහභාගී වන ලදී.

අනතුරුව පාබළ හමුද කාන්තා සංගමයේ සභාපතිනි එස් කෝට්ටේගොඩ මැතිණිය සභාව පෙරටුවට සපැමිණි අතර අනෙකුත් වන්දි ලාභීන් වෙනුවෙන් ප්‍රේෂණ පත් ප්‍රධානය කිරීමට යුහුසුලු විය. පෙරවරු 1030 පැයට පමණ ආරම්භ කළ ප්‍රේෂණපත් ප්‍රධානය පෙරවරු 1230 පැය පමණ වන තෙක් ලබා දෙන ලදී. මෙතෙක් වේලා සභාවේ අසුන්ගෙන මෙම සියලු උත්සව කටයුතු වෙනුවෙන් මග පෙන්වූ නියමුවානන් වූ සේනාවිධායක කර්නල් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී සහ මේජර් එස්කේජීඑන්බී ඇහැලමල්පේ ආර්එස්පී ශ්‍රීලපාභ ප්‍රධාන ආරාධිත අමුත්තා සමග සභාවෙන් නික්ම යාමට මත්තෙන් පැමිණ සිටි රණවිරු ඥතීන් වෙනුවෙන් රෙම ශ්‍රීලපාභ හි පිළියෙළ කර තිබූ දිවා භෝජන සංග්‍රහයට පැමිණෙන ලෙස ආරාධනා කිරීමට අමතක නොකළේය.

රක්‍ෂණ වන්දි ලාභීන් සහ ඔවුන් සමග පැමිණි හිත මිතුරු ඥතීන් 300 කට ආසන්න ප්‍රමාණයක් සඳහා එදින දිවා භෝජන සංග්‍රහය වෙනුවෙන් ප්‍රනීත ආහාර වේලකින් සංග්‍රහ කිරීමට වෙහෙස මහන්සි වී තිබුණු අතර, සියලු දෙනාම එම අවස්ථාවට සහභාගී වී සිටිනු දක්නට ලැබුණි.විටෙක පසෙකින් කන්කළු රණ ගී මියුරු ස්වරයන් වාදනය වෙද්දී තවත් විටෙක රෙම ශ්‍රීලපාභ පෙරදිග නැටුම් කණ්ඩායම විසින් බලා සිටියවුන් උද්දමයට පත් කිරීමට තරම් නැටුම් දර්ශනයක් ඉදිරිපත් කිරීමට ක්‍රියා කර තිබුණි. දිවා ආහාර සංග්‍රහය බුක්ති විඳීමෙන් පසු මෙම මනස්කාන්ත නැටුම් සංදර්ශනය නැරඹූ ඔවුන් තමන්ගෙන් සමුගත් ආදරණීය විරුවා ශ්‍රී ලංකා පාබල හමුද රෙජිමේන්තුවේ සාමාජිකයෙකු වීමට ලැබීම භාග්‍යයක් වූ බවට ආඩම්බරයක් සිතෙහි ඇති වූ බව ඔවුන්ගේ සාකච්ඡා වලින් පිළිබිඹු වූ කරුණකි.

මෙකී සියලු කටයුතු වෙනුවෙන් කැප වූ රෙම ශ්‍රීලපාභ සියලුම නිලධාරී / සෙසු නිලයින් මෙම පින්වත් ඥතීන් හට තම ගම්රටවල් බලායාම සඳහා කොළඹ කොටුව, අවිස්සාවේල්ල හා හෝමාගම දක්වා ප්‍රවාහන පහසුකම් ලබා දීමට ද අතපසු නොකර තිබුණි.

අපගේ සොයුරු විරුවන් වෙනුවෙන් ගත් වීර්යය සාර්ථක විනි. මෙම මාහැඟි පුණ්‍යෝපාකාරය ක්‍රියාවට නංවා සාමාජිතිය දක්වා සාර්ථක කර ගැනීමට රෙම ශ්‍රීලපාභ සියලුම නිලධාරී / සෙසු නිලයින් ගේ එකමුතු බව හා කැපවීම ඉවහල් වූ බව සිහිපත් කළ යුතුම වේ. රෙම ශ්‍රීලපාභ හිටපු සේනාවිධායක ලුතිනන් කර්ල් පී පී ද සිල්වා ඩබ්ඩබ්වී, ආර්ඩබ්පී, ආර්එස්පී ශ්‍රීලපාභ ගේ මූලිකත්වයෙන් ආරම්භ කරන ලද 'රණවිරු සුභසාධක අංශය' විසින් සංවිධානය කළ සමූහ රක්‍ෂණ වන්දි මුදල් ප්‍රධානය - 3 වන අධියර වන මෙය අප රෙජිමේන්තුවේ රණවිරුවන් වෙනුවෙන් කලහැකි, කල යුතු උදර මෙහෙවරක එක් කර්තව්‍යයක් වේ. තවත් මියගිය රණවිරුවන් බොහෝ පිරිසක් වෙනුවෙන් අපගේ මෙහෙය කැපකිරීමට තිබෙන බැවින් ඔවුන් සඳහා වන්දනීය පූජාවක් පැවැත්වීමට නුදුරේ දිනයක් යෙදෙනු ඇත. එම දිනය එන තෙක් අප ඉමහත් බලාපොරොත්තුවෙන් සිටිමු.

'සෑම සොල්දදුවෙකුම මිනිසෙකි,
එහෙත්,
සෑම මිනිසෙකුටම සොල්දදුවෙක් විය නොහැක.

**සෙ/300314 කෝප්‍රල් සුනන්ද එස්කෙන්**
**රණවිරු සුභසාධක අං ශය**
**රෙම ශ්‍රීලපාභ**

# "කාය වර්ධන ක්‍රීඩාවේ නියැලෙමින් ඉදිරියට යන පාබල සෙබළෙක්"

3 ශ්‍රීලපාහ ඒකකය වෙතින් ආබාධිත හේතුන් මත රෙජිමුන්ත ශ්‍රීලපාහ වෙත ඇතුළත් කර සිටින සෙ/312142 සාසෙ පෙරේරා කේඩීකේ විසින් 1999 වර්ෂයේ සිට 2001 වර්ෂය දක්වා කාය වර්ධන ක්‍රීඩාවේ නියැලෙමින් පහත සඳහන් ජයග්‍රහණයන් ලබාගෙන ඇත.

2000 ආබාධිත ජාතික ශූරතාවලියට සහභාගී වෙමින් කි.ග්‍රෑ 52 ක බර පංතිය නියෝජනය කරමින් බෙන්ච් ප්‍රෙස් ක්‍රමයට බර උසුලන ලදී. එම තරගයෙන් ප්‍රථම ස්ථානය දිනා ගන්නා ලදී.

2000 වර්ෂයේ යුධ හමුද ආබාධිත පවර් ලිෆ්ටින් ශූරතාවලියට සහභාගී වෙමින් බෙන්ච් ප්‍රෙස් ක්‍රමයට කි.ග්‍රෑ. 80 ක බර උසුලන ලදී. එම තරගයෙන් දෙවන ස්ථානය හිමි කර ගන්නා ලදී.

මීගමුව "සුපර් ඊගල් ක්‍රීඩා සමාජය " විසින් 2000 වර්ෂයේ පවත්වනු ලැබූ පවර් ලිප්ටින් ශූරතාවලියට සහභාගිවෙමින් බෙන්ච් ප්‍රෙස් ක්‍රමයට බර උසුලමින් දෙවන ස්ථානය හිමි කරගන්නා ලදී.



සෙ/312142 සාසෙ පෙරේරා කේඩීකේ විසින් ඉහත සඳහන් තරගාවලියට එම සෙනි විසින් ලබා ගන්නා ලද කුසලාන සමගින් ජායාරූපයකට පෙනී සිටින අයුරු

2001 වර්ෂයෙ යුධ හමුද පවර් ලිෆ්ටින් ශූරතාවලියට සහභාගී වෙමින් ක්‍රි.ගෑ 52 ක බර පංතිය නියෝජනය කරමින් තුන්වන ස්ථානය හිමි කරගන්නා ලදී.

"රත්මලාන ශක්ති වර්ධන ක්‍රිඩා සමාජය" විසින් මෙහෙයවන ලද 2001 වර්ෂයේ කාය වර්ධන හා පවර් ලිෆ්ටින් ශූරතාවලියට සහභාගී වෙමින් දෙවන ස්ථානය හිමි කරගන්නා ලදී.

2001 දෙසැම්බර් මස රත්මලාන "සොයිසාපුර" පවත්වනු ලැබූ ශ්‍රී ලංකා පවර් ලිෆ්ටින් ශූරතාවලියට සහභාගී වෙමින් ක්‍රි.ග්‍රෑ 52 ක බර පංතිය නියෝජනය කරමින් ප්‍රථම ස්ථානය හිමි කර ගන්නා ලදී.

තව ද මෙම සෙනි මෙම දිනවල 2002 පනාගොඩ යුධ හමුද ශාරීරික අභ්‍යාස මධ්‍යස්ථානය වෙතින් පැවැත්වීමට නියමිතව ඇති පවර් ලිප්ටින් හා කාය වර්ධන ශූරතාවලියට ඉදිරිපත් වීම සඳහා පුහුණු කටයුතුවල යෙදෙමින් සිටියි.

(බුද්ධි අංශය - රෙජිමුන්ත ශ්‍රීලපාහ)

# Does it Matter?



*Does it matter - losing your legs?*
*For people will always be kind,*
*And you need not show that you mind*
*when the others come in after a battle*
*To gobble their rice and curry.*

*Does it matter - losing your sight?*
*There's such splendid work for the blind;*
*And people will always be kind*
*As you sit in the aisle remembering*
*And turning your face to the light*

*do they matter - those dreams from the pit?*
*You can drink and forget and be glad,*
*And people won't say that you're mad;*
*For they'll know that you've fought for your country*
*And no one will worry a bit*

*T. V. Perera*

# කතරගම වන්දනා චාරිකාවේ විශේෂ අවස්ථා

රෙජිමුබ ශ්‍රීලපාහ වෙතින් 2000 වර්ෂයේ යුධ හමුදා ආබාධිත ක්‍රීඩා උළෙලේ ශූරතාවය ලබා ගැනීමට උර දුන් සියලුම ක්‍රීඩක නිලධාරි / සෙසු නිලයින්ගේ චිත්ත ධෛර්ය උසස් මට්ටමකට ගෙන යාම සඳහා කතරගම වන්දනා චරිකාවක් 2001.11.17 සහ 18 යන දිනයන් හි දී සංවිධානය කරන ලදී.



රෙජිමුබ ශ්‍රීලපාහ දෙවන අණදෙන නිලධාරී මේජර් ජේඑම්අයිඑස් ජයසුන්දර.ආර්එස්පී, ශ්‍රීලපාහ හා රෙසැමේ බනි II තෙන්නකෝන් ටීඑම් විසින් ප්‍රධාන කපු මහතා වෙත පළතුරු වට්ටි ලබා දෙන අයුරු.



නිලධාරී අණදෙන කපිතාන් ඊසීජේ වාසගේ, ශ්‍රීලපාහ විසින් කපු මහතා වෙත පළතුරු වට්ටිය ලබාදෙන අයුරු. එම අවස්ථාවේ ඒකක දෙවන අණදෙන නිලධාරී මේජර් ජේ එම්අයිඑස් ජයසුන්දර, ආර්එස්පී ශ්‍රීලපාහ ඡායාරූපයේ වේ.



කතරගම වන්දනා චාරිකාවේ දී පළතුරු වට්ටිය රැගෙන කතරගම පූජා භූමියට ඇතුලුවන සෙබලු පිරිසක්



කතරගම වන්දනා චරිකාවේදී කිරින්දේදී සමූහ ඡායාරූපයක පෙනී සිටින අයුරු

# කණ්ඩායම් සාමූහික පුහුණුවීම් - 10ශ්‍රීලපාහ "බී" කණ්ඩායම

පසුගිය වසරේ එනම්, 2001.05.05 දින වවුනියාව ඕමන්ත ප්‍රදේශයේදි දෙවන වරට ස්ථාපනය කරනලද 10 ශ්‍රීලපාහ ඒකකයේ කණ්ඩායම් අතුරින් "ඒ"සහ "බී" කණ්ඩායම් ඕමන්ත නැගෙනහිර ඉදිරි ආරක්‍ෂක වළල්ලේ රාජකාරි කටයුතු වල නිරතවිය. ඒකකය ස්ථාපනය කිරීම සඳහා වෙනත් ශ්‍රීලපාහ ඒකක වෙතින් හා ආධුනික සෙනින් බොහෝ පිරිසක් පැමිණ සිටි අතර, ප්‍රදේශයේ පැවැති ක්‍රියාත්වි තත්ත්වය මත බලඇණියක් වශයෙන් සාමූහික පුහුණුවීම් සිදු කිරීමට හැකියාවක් නොතිබුණි.කණ්ඩායම තුළ සිටි වෙනත් ශ්‍රීලපාහ ඒකක වලින් පැමිණි සෙනින් හා විශේෂයෙන්ම ආධුනික සෙබලුන් තුළ සාමූහික වශයෙන් ක්‍රියාත්විත සඳහා සහභාගී වීමට යෝග්‍ය මානසික තත්ත්වය හා චිත්ත ධෛර්ය වර්ධනය කිරීම උදෙසා පුහුණුවීම් කටයුතු වල අවශ්‍යතාවය තදින්ම දැනෙන ලදී. ඒ අනුව ඒකක අණදෙන නිලධාරී වන මේජර් එච්එම්ජේකේ ගුණරත්න,ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී, ශ්‍රීලපාහ සහ කණ්ඩායම් නිලධාරී අණදෙන වරුන් විසින් සාකච්ඡාකර කණ්ඩායම් මට්ටමින් සාමූහික පුහුණුවීම් කටයුතු සිදු කිරීමට කටයුතු සලසන ලද අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් 10 ශ්‍රීලපාහ "බී" කණ්ඩායම 2001.10.05 දින සිට සති 05 ක කාලයක් තුළ කණ්ඩායම් සාමූහික පුහුණුවීම් සිදු කිරීමට කටයුතු කරන ලදී.

මෙම සාමූහික පුහුණුවීම් පාඨමාලාව සඳහා පාබල බළඇණියකට ආවේනික වූ පුහුණුවීම් මෙන්ම දැනට පවතින ක්‍රියාත්විත වලට ආවේනික විෂයන් වන "සතුරු කඳවුරු අත්පත්කර ගැනීමේ සරඹ, බංකර් විනාශ කිරීම්, යුධ භූමියේ උපක්‍රමශීලිව ගමන්කිරිම, සිතියම් කියවීම, මූලික යුධ උපක්‍රම, ප්‍රතිවිප්ලව සටන් ක්‍රම, බාධක තරණය, ප්‍රගුණ වෙඩිකරු මූල ධර්ම, මුර සෙබළ රාජකාරි, රණබිම් ක්‍රම, නගරබද සටන්, නායකත්වය, ජීව වෙඩි තැබීම් හා ප්‍රථමාධාර, වෙඩි ද්‍රව්‍ය හඳුන්වාදීම, කාලතුවක්කු ඉලක්කපත් ලබාගැනීම, සංඥකතා පිළිවෙත ආදී කරුණු ඇතුළත් විෂය මාලාවකින් පාඨමාලාව සැලසුම් කරතිබූ අතර, 2001.10.05 දින "බී" කණ්ඩායම 10 ශ්‍රීලපාහ නිලධාරී අණදෙන වන කපිතන් කේඩීඑල්සී විජේනායක, ආර්ඩබ්පී, ආර්එස්පී, ශ්‍රීලපාහගේ ආරම්භක දේශණයෙන් පසුව වවුනියාව ඕමන්ත ප්‍රදේශයේ දී මෙම කණ්ඩායම් සාමූහික පුහුණුවීම් පාඨමාලාව ආරම්භ විය.

පාඨමාලාව ආරම්භයේ දී සෙබළුන්ගේ කාර්යක්‍ෂමතාවය ඉතා පහල මට්ටමක තිබූ අතර, පාඨමාලාව ආරම්භ වී දින කිහිපයකට පසු ප්‍රායෝගික පුහුණුවීම් තුළින් ඔවුන්ගේ කාර්යක්‍ෂමතාවය හා හැකියාවන් ක්‍රම ක්‍රමයෙන් දියුණු කර ගැනීමට සෙබළුන් සියළුම දෙනා සමත් වූවා මෙන්ම සෑම සෙබලෙකුම මහත් උනන්දුවකින් හා කැපවීමකින් යුතුව පුහුණුවීම් කටයුතු සිදුකරගෙන යනු ලබන බව දැක ගැනීමට හැකිවිය. මෙම සාමූහික පුහුණුවීම් තුලින් නව සටන් ක්‍රම පිළිබඳ අවබෝධයක් ඇති කර ගැනීම මෙන්ම සාමූහික වශයෙන් එකිනෙකා අතර ඇති අන්‍යෝන්‍ය සබඳතාවය හා දැඩි විශ්වාසය වර්ධනය කර ගැනීමට හැකිවීම ද කණ්ඩායම් භට පිරිස් ලත් ජයග්‍රහණයක් ලෙස ද සැලකිය හැකිය. සෙබලාට දිය හැකි උසස්ම සුභ සාධනය වන්නේ පුහුණුවයි. පුහුණු සෙබලෙකු භට සියල්ල ජයගත හැක. පුහුණුවේ පමණට රාජකාරිය ජය ගැනීමටත් එමගින් සතුරාට පෙර සතුරා විනාශ කර අපේක්‍ෂා අත්පත් කර ගැනීමට සෙබලාට පිළිවන. මෙම සාමූහික පුහුණුවීම් හුදෙක්ම ඔවුන් වෙත ලබා දෙනුයේ යුද්ධයේ දී ඔවුන් හා අන්‍යයන්ගේ ජීවිත ආරක්‍ෂා කර ගනිමින් ජය ලබා ගැනීමටයි. තව ද මෙවැනි පුහුණුවීම් තුළින් සෙබලෙකු භට ධෛර්යය විශ්වාසවන්ත බව, පක්‍ෂපාතීත්වය, සහෝදරත්වය, විනය, දරාගැනීමේ ශක්තිය, පරීක්‍ෂාකාරී බව හා විචක්‍ෂණ බුද්ධිය යනාදිය ද වර්ධනය කරගැනීමට හැකිවීම ද විශේෂ කරුණකි. එසේම මෙවැනි පුහුණුවීම් තුළින් (විමර්ශනය හා නව සටන් ක්‍රම) සතුරාගේ අරමුණ මොනවාදැයි යන්න පිළිබඳ නිවැරදි අවබෝධයක් හා සතුරා පරාජය කර සටන් ජය ගැනීමට තමා පිළිබඳ පූර්ණ ස්වයං විශ්වාසයක් ගොඩනගා ගැනීමටත් හැකිවීම 10 ශ්‍රීලපාහ "බී" කණ්ඩායම ලත් ජයග්‍රහණයක් වනු ඇත.

කණ්ඩායමේ සෙබළුන් සියළුම දෙනා මේ බැව් තේරුම් ගෙන දහඩිය වගුරවමින් ඉතාමත් කැපවීමකින් හා උනන්දුවකින් යුතුව උරෙන් උර ගැටී එකාමෙන් ඉතාමත් සාර්ථකව මෙම සති 05 ක කෙටි පුහුණුව නිමා කරන ලද අතර, පුහුණුව අවසානයේ එනම් 2001.11.12 දින සිට දින 06 ක විශේෂ වන සටන් අභ්‍යාසයක් ද පුහුණු වූ අතර. ඒ සඳහා 563 බසේමු අවට ප්‍රදේශය යොදා ගන්නා ලදී. මෙහි දී සතුරු කඳවුරු විමර්ෂණය කිරිම, සතුරු කඳවුරකට පහර දීම, තම කඳවුරට සතුරා ප්‍රහාර එල්ල කිරීමේ දී කඳවුර රැක ගැනිම යනාදිය ඉතා උනන්දුවෙන් හා කැපවීමකින් යුතුව කණ්ඩායමේ සියළුම නිලධාරී / සෙසුනිළයින් විසින් පුහුණුවන ලදී. තව ද, විශේෂයෙන්ම මෙම වනසටන් අභ්‍යාසය තුළින් තනි තනිව හා කුඩා කණ්ඩායම් වශයෙන් දින ගණනක් වුව ද නිරාහාරව

සිට සතුරු භූමියේ සැරිසරමින් සතුරාගේ එදිනෙද ක්‍රියාකාරකම් හා සතුරු කඳවුරු තුළට උපක්‍රමිකව ඇතුළු වී එහි එදිනෙද ක්‍රියාකාරකම් ද විමර්ෂණය කර එම විමර්ෂණයන් තුළින් ලබාගත් දෑ ප්‍රයෝජනයට ගෙන විවිධ ප්‍රහාරයන් සැලසුම් කිරීම හා සතුරා /සතුරු කඳවුරු වෙත දවැන්ත ප්‍රහාර එල්ල කිරීමට ද පුරුදු පුහුණු විය. පුරා සති 05 ක කාලයක් පැවැත්වූ මෙම කණ්ඩායම් සාමූහික පුහුණුවීම් කටයුතු සියළුම නිලධාරී /සෙසු නිළයින් විසින් 2001.11.17 දින ඉතා සාර්ථකව නිමාවට පත් කරන ලදී.

කණ්ඩායම් පුහුණුවීම් උසස් අන්දමින් සාර්ථකව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මූලික පෙර මග ඒකක අණදෙන නිලධාරී වන මේජර් එච්එම්ජේකේ ගුණරත්න, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී, ශ්‍රීලපාහ යන ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ මග පෙන්වීම යටතේ සිදුකළ අතර, සියළුම පාලන කටයුතු වල දී ඒකකයේ දෙවන අණදෙන නිලධාරී වන මේජර් කේපීඑච්ඩී ද සිල්වා, ආර්එස්පී, ශ්‍රීලපාහ සහ බළඇණි පුහුණු වීම් භාර නිලධාරී වන මේජර් ඩීඩබ්ආර්ජේජ්කේ දිසානායක ආර්එස්පී ශ්‍රීලපාහ යන ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙතින් ලැබුණු නොමසුරු සහයෝගය ද ඉමහත් පිටුවහලක් විය. ඉන් පසු මෙම ඒකක "ඩී" කණ්ඩායම පුහුණුවීම් කටයුතු සඳහා පිටත් කර යැවීම පිණිස මෙම කණ්ඩායම නැවත 2001.11.18 දින ඕමන්ත ඉදිරි ආරක්ෂක වළල්ලේ රාජකාරීන් භාරගත් අතර, ක්‍රියාන්විත දක්ෂතාවයන් පෙන්නුම් කරමින් "සේවය කරමි" යන ශීර්ෂ පාඨය මගින් ලක් දෙරණට සේවය කිරීමට 10 න බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදව "බී" කණ්ඩායම සැදී පැහැදී සිටින බව ආඩම්බරයෙන් යුතුව සිහිපත් කරමි.

**කපිතන් කේඩීඑල්සී විජේනායක, ආර්ඩබ්පී.ආර්එස්පී. ශ්‍රීලපාහ**
**නිලධාරී අණදෙන "බී" කණ්ඩායම**
**10 ශ්‍රීලපාහ යුධ හමුද කඳවුර**
**ඕමන්ත - වවුනියාව**

# යුධ හමුද නායකත්වය

## කොනොනියෙකුගේ තත්ත්වය කෙසේ විය යුතු ද?

අමෙරිකානු යුද හමුද කොනොතින්ගේ නායකත්වය හැකියාවන් දියුණු කර ගැනීම මූලික කරගෙන මෙය සකස් කරන ලද්දක් වන අතර, ශ්‍රී ලංකා යුධ හමුදවේ කොනොතින්ගේ ඔවුන්ගේ නායකත්වය දියුණු කිරීම සඳහා අපට සුදුසු ආකාරයට වාක්‍ය සමූහයකින් නිර්මාණය වී ඇත.

මෙමගින් නායකයෙකු වශයෙන් මම කවුද මාගේ කාර්ය මොනවාද? යන්න පිළිබඳව දැනුමක් ලබාදෙන අතර, මෙම වාක්‍ය සෑම එකක්ම අනුගමනය කිරීම තුළින් නිවැරදි නායකත්වයෙන් ජයග්‍රහනය ලබා ගැනීමට හැකි වනු ඇත.

1 වාක්‍යය - වෘත්තීය නිපුණත්වය අතින් මට වඩා සුදුස්සෙකු නැත
2 වාක්‍යය - මම කොමිෂන් තොලත් නිලධාරියෙකි ඒත් සෙබලෙකි
3 වාක්‍යය - යුධ හමුදවේ කොඳු නාරටිය නමින් හඳුන්වන කොමිෂන් නොලත් නිලධාරීන්ගේ සාමාජිකයෙකු වීම මම අගේ කොට සලකමි.
4 වාක්‍යය - මම කොමිෂන් නොලත් නිලධාරියෙක් වශයෙන් බළකාය සම්බන්ධයෙන් ආඩම්බරයට පත්වන අතර, මා කුමන අවස්ථාවක කුමන තත්ත්වයක සිටිය ද, සෑම විටම මාගේ බළකායේත් හමුදවේත් මාගේ මව් බිමේත් ගෞරවය රැකෙන පරිදි හැසිරෙමි / ක්‍රියා කරමි.
5 වාක්‍යය - මම පෞද්ගලික ආරක්ෂව, ලාභය හෝ අභිමතය ළභාකර ගැනීම සඳහා මම මගේ තනතුරේ තත්ත්වය කිසි විටෙක උපයෝගී කර නොගනිමි.
6 වාක්‍යය - කාර්යක්ෂමතාවය යනු මගේ ආදර්ශය පාඨයයි
7 වාක්‍යය - පැවරෙන රාජකාරි ඉටු කිරීම හා මාගේ සෙබළ පිරිසගේ සුභසාධනය සොයා බැලීම යන වගකීම මාගේ මනසයේ ස්ථිරවම පවතී.
8 වාක්‍යය - යුධ උපාය, නිපුණත්වය හා ශිල්පීය දක්ෂතාවය උපරිම මට්ටමින් පවත්වා ගැනීමට මට හැකි සියළුම පරිශ්‍රමයක්ම දරමි
9 වාක්‍යය - කොමිෂන් නොලත් නිලධාරියෙකු වශයෙන් මම මාගේ වගකීම හොඳින් දනිමි.
10 වාක්‍යය - සෑම සෙබළකුටම හිමි විශිෂ්ඨ නායකත්වය මම ඔවුන්ට ලබා දෙමි
11 වාක්‍යය - මාගේ සෙබලුන් ගැන මම හොඳින් දනිමි. මාගේ අවශ්‍යතාවය ඉටු කර ගැනීමට පෙර ඔවුන්ගේ අවශ්‍යතාවය පිළිබඳ සොයා බලමි
12 වාක්‍යය - මම සෑම විටම මාගේ සෙබළුන් සමග අදහස් උදහස් හුවමාරු කර ගනිමි. ඔවුන් දැනුවත් කරමි.
13.වාක්‍යය - සුදුසුකම් සඳහා නියෝග වරප්‍රසාද ලබාදීමේ දී මෙන්ම චෝදනා සඳහා දඬුවම් ලබාදීම සඳහා නිර්දේශ කිරීමේ දී මම සාධාරනත්වය හා අපක්ෂපාතීත්වයෙන් ක්‍රියා කරමි.
14 වාක්‍යය - මාගේ ඒකකයේ නිලධාරීන් හට ඔවුන්ගේ රාජකාරිය ඉටු කිරීම සඳහා ඒ සඳහා උපරිම කාලයක් යෙදවිය හැක. මාගේ රාජකාරිය ඉටු කර ගැනීමට සහභාගී වීමට ඔවුන්ට කාලයක් ඉතිරිව නැත.
15 වාක්‍යය - මම නිලධාරීන්ගේ මෙන්ම මාගේ සෙබලුන්ගේ ද ගෞරවය විශ්වාසය දිනා ගනිමි.
16. වාක්‍යය - මාගේ ජ්‍යෙෂ්ඨයන්ට මෙන්ම සහෝදර කොනොනින් හට ද සෙබළ පිරිසට ද, මම ඒකකයේ නීති ගරුක කොනොනි වෙමි.
17. වාක්‍යය - නියෝග නොලද විටක දී පවා අවස්ථානුකූලව බුද්ධිමත්ව නිවැරදි තීරණ ගනිමි
18. වාක්‍යය - මගේ චිත්ත ධෛර්ය හා අවංක භාවය අඛණ්ඩව උසස් මට්ටමින් තබා ගනිමි.

කොනොනි වරයෙක් වශයෙන් ඉහත වාක්‍යයන් ඔබගේ උත්සාහයෙන් ඉගෙන ගෙන ඔබගේ හට පිරිස් වඩා ඉහළ ප්‍රමිතියකින් යුතුව කටයුතු කරනු ඇත. මෙම වාක්‍ය මාලාව පිළිපැදීම තුළින් තමන්ගේ හමුද ජීවිතය මෙන්ම සිවිල් ජීවිතයේ දී හමුවන ගැටලු වලට නිසි පිළිතුරු ඔබට සොයා ගැනීමට හැකියාවක් වන අතර, ආදර්ශමත් ජීවිතයක් ගත කිරීමේ හැකියාව ලැබෙනු ඇත.

**සෙ/14ඩී00197 සැරයන් මෛත්‍රීපාල ඩීඑම්**
**14 (සෙව්) ශ්‍රීලපාහ "ඩී" කණ්ඩායම උසත් - මිරුසුවිල් යාපනය**

# ශ්‍රී ලංකා පාබල හමුදා සංගමයේ 51 වන වාර්ෂික මහා සභා රැස්වීම...

ශ්‍රී ලංකා පාබල හමුදු සංගමයේ 51 වන වාර්ෂික මහා සභා රැස්වීම මේජර් ජෙනරාල් ඒ. එම්. යූ. සෙනෙවිරත්න ආර්එස්පී, යූඑස්පී, එන්ඩීසී ගේ ප්‍රධානත්වයෙන් වර්ෂ 2002 ක් වූ ජනවාරි මස 27 වන දින 0900 පැයට රෙම ශ්‍රීලපාහ අංක 01 දේශණ ශාලාවේ දී පවත්වන ලදී. මේ සඳහා සේවයේ නියුතු ශ්‍රීලපාහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ සෙසු නිළයින් සහභාගී වන ලදී.

එම රැස්වීමෙන් අණතුරුව පැමිණි සිටි නිලධාරීන් සහ සෙසු නිළයින් රෙජිම කෞතුකාගාරය සහ ඔවුන් වෙනුවෙන් සූදනම් කර තිබූ අවි ප්‍රදර්ශණය ද නරඹන ලදී. මෙම අවි ප්‍රදර්ශණය සඳහා පැරණි මෙන් ම නවීන අවි ද ඇතුළත් වන ලදී.

ඉන් අණණතුරුව පැමිණි සිටි නිලධාරී / සෙසු නිළයින් හට සෙසු නිළ භෝජනාගාරයේ සූදනම් කර තිබූ බීම සාදය සහ දිවා භෝජන සංග්‍රහය භුක්ති විඳීමෙන් අණතුරුව සතුටින් විසිර යන ලදී.එදින ලබාගත් ඡායාරූප පහත දක්වා ඇත.



මේජර් ජෙනරාල් ඒඑම්යූ සෙනෙවිරත්න ආර්එස්පී,යූඑස්පී,එන්ඩීසී රැස්වීමේ මුලසුන හොබවමින්... (ඡායාරූපයේ මැද)





රැස්වීමට සහභාගී වූ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ සෙසු නිලයින්..





අවි ප්‍රදර්ශණයේ අවස්ථා දෙකක්...

# සේවය ඇගයීම් (Letters of Appreciation)

ශ්‍රී ලංකා පාබල හමුදා සංගමයේ 51 වන වාර්ෂික මහා සභා රැස්වීම 2002 ජනවාරි මස 27 වන දින රෙජිම ශ්‍රීලපාහ අංක 01 දේශණ ශාලාවේ දී පවත්වන ලදී. එදින රැස්වීම් සහ අනෙකුත් ප්‍රදර්ශන කටයුතු ඉතා උසස් මට්ටමකින් සංවිධානය කර තිබු බැවින් ඒ සඳහා ස්තුති කර මේජර් ජෙනරාල් යු. ඒ. කරුණාරත්න පීඑස්සී විසින් මධ්‍යස්ථාන සේනාවිධායක ශ්‍රීලපාහ වෙත එවන ලද ලිපියක් පහත පළකර ඇත.

28th Jan 2002

Centre Commandant,

Without any hesitation, I can say that, so far, the SLLI Association AGM on 27th Jan was the best organized AGM I have attended. Firstly as the Vice patron of the Association and also as a former CO of the 1 SLLI wish to thank you and your staff for all the arrangements you had made to make our annual get-together more interesting and educative. Like me, I am sure, all the other participants saw the new equipment acquired by the Army to be used against the terrorist. Well done and many thanks.

Yours Sincerely
Maj General Upali A Karunaratne psc,
vice Parton
Ex-servicemen Association - SLLI

**2002 ජනවාරි මස 11 වන දින රෙම ශ්‍රීලපාහ හි දී පවත්වන ලද රකෂණ වන්දි ප්‍රධානෝත්සවයට පැමිණි සටනේ දී මියගිය 7 ශ්‍රීලපාහ ඒකකයට අයත් සෙ/308666 සාසෙ පත්මලාල් ආර්ආර්එස් ගේ පියා විසින් එවන ලද ලිපියක් පහත පළකර ඇත.**

ඒ. ආර්. පිරිස්හාමි
කපුවත්තේ ගෙදර
ගල්ගොඩ, වැලිමඩ
2002.01.16

රණවිරු සුභසාධක අංශය
මේජර් තුමනි,

මෙම හසුන් පත ඔබ තුමා අතට පත් කිරිමට යෙදුනේ මගේ දියණියගේ විවාහ මංගල උත්සවය 2002.01.30 වෙනි දින අප නිවසේ දී පැවැත්වෙනවා. ඉතින් එම අවස්ථාවට අපගේ අතුරුදන්වූ රනවිරු පුත් සුදත් පත්මලාල් වෙනුවෙන් රෙජිමේන්තු මධ්‍යස්ථානයෙන් සහභාගී කරවන මෙන් ඉතා බැගෑපත්ව ඉල්ලා සිටිමි.

තව ද අප මේ වනතුරු සිතා සිටියේ පුතාගේ අතුරුදන්වීමෙන් පසු අප තනි වුනාය කියා. නමුත් එද රක්ෂණ වන්දි උත්සවයට සහභාගී වූ අවස්ථාවේ වැටහුනා අපගේ පුතා නැති වූ අඩුව පිරිමැසීම සඳහා අපට තව සිය ගණනක සෙබල පුතාලා සිටින බව. අසරණව සිටින අපට එය විශාල ශක්තියක්වුනා. අපගේ ජීවිත වලට, අප එද රෙජිමේන්තු මධ්‍යස්ථානයෙන් පිටව ආවේ අපගේ ආදරණීය දරුවන් සමූහයකගෙන් ඈත්වන්නාසේ ශෝකයකිනි.

අසරණව සිටි අපව කැඳවා කඳවුර භූමියට ඇතුල් වූ වේලාවේ සිට පිට වන තෙක් අපට සලකපු සංග්‍රහයට අනේකවාරයක් ඔබතුමන්ලා සියලු දෙනාටම ස්තුති වන්ත වෙමු.

නැවතත් මම ඉතාමත් කරුණාවෙන් අපගේ නිවසේ පැවැත්වෙන උත්සවය වෙනුවෙන් මගේ පුතාගේ නාමයෙන් සහභාගී වන ලෙසට ඉතාමත් ගෞරවයෙන් ආරාධනා කරමි.

ස්තුතියි
මීට
විශ්වාසී වූ
ඒ. ආර්. පිරිස් හාමි

# ඉතිහාසය තුළින් වර්ණවත් වන - 2(සෙව්) ශ්‍රී ලංකා පාබල හමුදාව

හිරු නොබසින රාජ්‍යයේ එක් යටත් විජිතයක් වූ කුඩා ශ්‍රී ලංකාව ද, මහා බ්‍රිතාන්‍යයේ අණසකට යටත් වීමෙන් අනතුරුව ඇගේ සෙවණේ ඇති දැඩි වූ 2(සෙව්) ශ්‍රී ලංකා පාබල හමුදව ලක්බිම පුරා විසිර සිටින්නා වූ හමුද දරු මුණුබුරු කැළකට ප්‍රෞඪ ඉතිහාසයක් කියාපාමින් වයසින් අවුරුදු 120 ක් වියපත් වුව ද බුදු පහස ලත් කැළණි මිටියාවතේ සිට එද මෙන් ම අදත් නිවැරදි මග පෙන්වමින් වර්ථමානයේ ඔබට මෙන්ම අනාගතයේ ඈ අභිමුව අත්පොත් තැබීමට බලා සිටින්නා වූ සෙබළ කැළට සාගරයක් බඳු වූ ඉතිහාසයෙන් දිය දේතක් වැනි ඒකක ඉතිහාසයෙන් බිඳක් මෙසේ සනිටුහන් කිරීමට වැයම් කරමි.

2(සෙව්) ශ්‍රී ලංකා පාබල හමුදවේ අවුරුදු 120 ක උරුමය තුළින් ඔවුන්ගේ ඒකක ඉතිහාසය මෙය වුවත්, වර්ථමානයේ බිහි වී තිබෙන්නා වූත්, සියළු හමුද ඒකකයන්ගේ මව් ඒකකය වන්නේ මෙම 2 වන ස්වේච්ඡා ශ්‍රී ලංකා පාබල හමුදව බැව් අමුතුවෙන් පැහැදිළි කළ යුතු නොවේ.

ලංකාවේ සම්පත් සූරා කෑමේ අදිටනින් මෙම රට ආක්‍රමණය කළා වූ ඉංග්‍රීසීන් කන්ද උඩරට දේශගුණිකත්වය කෙරෙහිත් ස්වාභාවික සරුසාර පොළොව කෙරෙහිත් දක්වූ ලොල් බව නිසා කන්ද උඩරට ආක්‍රමණය කර එහි බළය සියතට ගත් බ්‍රිතාන්‍යයන් පළමුව කෝපි ද, පසුව තේ වගාව ද ආරම්භ කරන ලදී. එම වතුවල වතු අධිකාරී ධූරයට පත් කරන ලද්දේ සුදු ජාතිකයන්ය. එම සුදු වතු අධිකාරීන් ලංකාවට පැමිණීමට පෙර මහා බ්‍රිතාන්‍යයෙහි හමුද නිලධාරීන් වශයෙන් හා අනෙකුත් නිළයන් වශයෙන් යුරෝපයේ නොයෙකුත් රටවල යුධ බිම් වල සේවය කළ නිලධාරීන් හෝ සෙසු නිලයන් විය. යුද්ධය පිළිබඳ පළපුරුදු පිරිසක් නිසා තමන්ට නුහුරු නුපුරුදු රටක මහා වතුයායන්හි ජනිත වූ කම්කරුවන් සමග සේවය කිරීමේ දී තමන් තනිවීමෙන් ඇතිවන සාංකාව පිරිමසා ගැනීම සඳහා සියළු වතු අධිකාරීන් එක්වී එවකට අග්‍රාණ්ඩුකාරධූරය හෙබවූ ශ්‍රීමත් ශ්‍රී ජෝර්ජ් මැකාරති ගෙන් හමුද ඒකකයක් පිහිටුවීමට අවසර ඉල්ලන ලදී.

එම ස්වේච්ඡා හමුදව ආරම්භ කිරීමට ප්‍රථම එහි සංයුතිය සහ නිළ ඇඳුම් පිළිබඳවත්, එම ඒකකය ස්වේච්ඡා ලංකා පාබල හමුදව වශයෙන් නම් කිරීමටත් භට පිරිස් සංඛ්‍යාව 1200 ක් පමණ වීමටත් මූල්‍ය ප්‍රතිපාදන වශයෙන් රුපියල් 5000/- ක් ලබා ගැනීමටත් 1881 ජනවාරි 27 වන දින මහා බ්‍රිතාන්‍ය අනුමැතිය පතන ලදී.

මූලික සැලසුම් කටයුතු නිමවීමෙන් අණතුරුව 1881 අප්‍රේල් 01 වන දින නගා සිටුවන ලද මෙම ස්වේච්ඡා ලංකා පාබල හමුදවේ ප්‍රථම අණදෙන නිලධාරි වශයෙන් ලුතිතන් කර්නල් ජෝන් ස්කොට් ආම් ටේජ් බ්‍රිතාන්‍ය රජය විසින් පත් කරන ලදී. මොහු මහා බ්‍රිතාන්‍යයේ 21 වැනි ලැන්නවරයර් රෙජිමේන්තුවේ නිලධාරියෙකු වූ අතර, ක්‍රිමියානු යුද්ධයේ දී රුසියාවට එරෙහිව මහා බ්‍රිතාන්‍ය වෙනුවෙන් සටනට ගිය යුධ සෙනෙවියකි. මෙතුමා ව්‍යාපාරිකයෙකු වශයෙන් ලංකාවට පැමිණීමෙන් පසු මෙම තනතුරට පත් කරන ලදී. පසු කළක දී මෙතුමාව ලංකාවටම බළපාන පරදි සමාදන විනිශ්චයකාර වරයෙකු හැටියට පත් කර ඇත.

අණදෙන නිලධාරීගේ ලේඛණ කටයුතු නිසි පරිදි පවත්වාගෙන යා යුතු නිසා ලංකාවේ ප්‍රථමයෙන් ම ස්ථාපිත කරන ලද මෙම ස්වේච්ඡා ලංකා පාබල හමුදවේ පරිපාලන කටයුතු විධිමත් අයුරින් පවත්වාගෙන යාම සඳහා ප්‍රථම විධායක අධිකාරි වශයෙන් මහා බ්‍රිතාන්‍ය රජය විසින් කපිතන් ජීඑල් ගොට්කින් එම ධූරයට පත් කරන ලදී.

ඉන් පසු මෙම ඒකකය පියවරින් පියවරට ඉදිරියට යාම ආරම්භ කරමින් 1881 නොවැම්බර් මස 26 දින ස්වේච්ඡා ලංකා පාබල හමුදවේ ප්‍රථම පරීක්ෂණ පෙළපාලිය වර්තමානයේ ජනාධිපති මන්දිරය ඉදිරිපට ඇති මුදලිගේ මාවත දනට "ග්ලෝබ්" හෝටලය පිහිටා ඇති ස්ථානයේ ඒකකයේ පළමු මූලස්ථානය පැවැති බැව් ඉතිහාසය අනුව පැහැදිලි වේ.

1881 නොවැම්බර් 30 වන දින ස්වේච්ඡා ලංකා පාබල හමුදවේ ගෞරවණීය කර්නල් පදවිය එවකට බ්‍රිතාන්‍ය රාජනිය වූ වික්ටෝරියා මහ රැජිනගේ ජ්‍යෙෂ්ඨ පුත්‍රයා වූ ද, වේල්ස් හි කුමරු වූද, පසුව හත්වන එඩ්වඩ් නමින් රජ පැමිණි කුමරු පත් කරන ලදී. පසුව එතුමාගේ අභිමතය පරිදි ඒකකයේ නිළ ලාංඡනය කුමරුගේ ඔටුන්නෙහි කුඩා වලල්ල අභ්‍යන්තරයෙහි සවිකර තිබූ සුදු පැස්බර පිහාටු තුන ඒකක ලාංඡනය ලෙසපැළඳීමටත්, කුමරුගේ ආදර්ශ පාඨය වූ "ඉච්ඩියන්" "සේවය කරමි" යන වැකිය ඒකකයේ ආදර්ශ පාඨය වශයෙන් භාවිතයට ගැනීමට අවසර දෙන ලදී.

පසුකලෙක එනම් වර්ෂ 1910 දී මෙම පැස්බර පිහාටු කේන්ද්‍ර කොටගෙන නළාවක් (බියුගලය) මීට එක්ව සීඑල්අයි අකුරු තුන එක් වූ බැව් ඉතිහාසයේ පත් ඉරු අතර සටහන්ව ඇත. (1950 දී ආරම්භ වූ නිත්‍ය ලංකා පාබල හමුදව ඇතුළු අනෙකුත් ස්වේච්ඡා සහ නිත්‍ය පාබල හමුදවන් අදටත් භාවිතා කරනු ලබන්නේ මෙම ස්වේච්ඡා ලංකා පාබල හමුදව (වර්තමානයේ දෙවන ස්වේච්ඡා ලංකා පාබල හමුදව) විසින් භාවිතා කරනු ලැබූ / ලබන සිරස් ලාංඡනය බව ඉතාමත් ආඩම්බරයෙන් කිව හැක)

1890 වර්ෂයේ දී මෙම ස්වේච්ඡා ලංකා පාබල හමුදවේ ප්‍රථම වාර්ෂික අභ්‍යාස කඳවුර ගාලු දිස්ත්‍රික්කයේ ඌරගස්මංහන්දිය නමැති ග්‍රාමයේ පවත්වා ඇති අතර, ඊට පසුව වරින් වර ලංකාවේ නොයෙක් ප්‍රදේශවල පැවැත්වූ වාර්ෂික අභ්‍යාස කඳවුරු වලින් පසු 1903 දී පුහුණු කඳවුරු පැවැති ස්ථානය වශයෙන් දියතලාව "බුයර්" වරුන්ගේ සිර කඳවුර තෝරාගෙන ඇත. වර්ථමානයේ දී දියතලාව යුධ හමුද අභ්‍යාස මධ්‍යස්ථානය වශයෙන් තෝරාගෙන ඇත්තේ ද මෙම පුහුණුවීම් කටයුතු කරන

ලද කඳවුරම බැව් ඉතිහාසය කියාපායි. මීට උදහරණයක් වශයෙන් දක්විය හැක්කේ 1901/1902 වර්ෂවල පැවැති සෙබළ නිවස්න මේ වනතෙක්ම පවතින ඒවා බව පැරණි ඡායාරූප අධ්‍යනය කිරීමේ දී පැහැදිලිවම පෙනේ.

මෙම ස්වේච්ඡා ලංකා පාබල හමුදවේ කණ්ඩායම් අතර තිබූ කාලතුවක්කු ඉංජිනේරු, අශ්වාරෝහක, ගිලන්මැසි යන කණ්ඩායම් පසු කලෙක හමුදවේ ව්‍යාප්තිය අනුව ස්වේච්ඡා කාලතුවක්කු බලඇණිය, ස්වේච්ඡා ඉංජිනේරු බළකාය, ස්වේච්ඡා අශ්වාරෝහක බළකාය, ස්වේච්ඡා වෛද්‍ය බළකාය වශයෙන් වෙන්ව යන ලදි.

1900 වර්ෂයේ දී ස්වේච්ඡා ලංකා පාබල හමුදවේ අශ්වාරෝහක කණ්ඩායම දකුණු අප්‍රිකාවේ පැවැති බුවර් යුද්ධයේ දී බ්‍රිතාන්‍ය හමුදවට සහාය වීම සඳහා දකුණු අප්‍රිකාව වෙත යවන ලදි. එම යුද්ධයේ දී ලංකා පාබල හමුදවේ අශ්වාරෝහක කණ්ඩායම විසින් දක් වූ අතිශූර දස්කම් නිසා එම දස්කම් ඇගැයීම් වස් බ්‍රිතාන්‍ය රජය විසින් බ්‍රිතාන්‍ය මහ රජුගේ වැඩිමහල් පුත් වූ (පසුව පස්වන ජෝර්ජ්) කාන්වොල්ස් හි ආදිපාද කුමරු විසින් ධජයක් පිරිනමා ඇත. එය වර්ණ ධජයක් නොව බ්‍රිතාන්‍ය රජයේ ධජයක අනුරුවක් වූ අතර, එය දරා සිටි යෂ්ඨිය මුදුනෙහි දකුණු අප්‍රිකාවේ, "සේවය ඇගයීම වෙනුවෙන්" යැයි ඉංග්‍රීසියෙන් සටහන් වී ඇත. එම යෂ්ඨිය සහ කොඩිය 1902 දී අශ්වාරෝහක කණ්ඩායම ස්වේච්ඡා ලංකා පාබල හමුදවෙන් වෙන් වී ස්වාධීන ඒකකයක් වීම සඳහා ඉවත්ව යාමේ දී එම ධජය සහ යෂ්ඨිය ගෙන ගොස් ඇති නිසා එය වර්ථමානයේ දී සොයාගත නොහැක.

1914/1918 ප්‍රථම ලංකා සංග්‍රාමයේ දී බ්‍රිතාන්‍ය හමුදවෙන්ගේ සහයට මෙම ස්වේච්ඡා ලංකා පාබල හමුදවෙන් භට කණ්ඩායමක් බ්‍රිතාන්‍යයට යවා ඇත. එම ස්වේච්ඡා සෙබළුන් යුරෝපයේ සිදුවූ සටන් වල දී තම රණකාමීත්වය ඉතා විශිෂ්ඨ අන්දමින් විදහා පා ඇත. එහි දී විශේෂයෙන් බ්‍රිතාන්‍ය යුධ ඉතිහාසයේ දක්වා ඇත්තේ සාජන් එඩ්වර්ඩ් ජැකොටින් නමැති සෙබළා තමා සමග සිටි සියළු යුධ භටයන් සතුරු ප්‍රහාරයෙන් මියගිය පසුත් සෙබළුන් විශාල පිරිසක් සිටින බව පෙන්වමින් යුධ අගලේ තැනින් තැන යමින් සටන් කළ නිර්භීත භාවයයි. මොහු පැය 06 ක් පමණ තනිවම සතුරා සමග සටන් කර අවසානයේ දී සතුරාගේ බෝම්බ ප්‍රහාරයකින් මියගොස් ඇතැයි බ්‍රිතාන්‍ය යුධ ඉතිහාසඥයකු වූ දෙස්තර සර් ආතර් කොනන්ඩොයිල් විසින් ඔහුගේ යුධ බිමේ දස්කම් නමැති පොතෙහි දක්වා ඇති බව සාමාන්‍ය සෙබළකු වශයෙන් හමුදවට බැඳි විශේෂ ගෞරවයට පාත්‍ර වූ කපිතාන් ඔස්කා එම් අබේරත්න (උපා) විසින් "ලංකා පාබල හමුද ඉතිහාසය" නම් ග්‍රන්ථයෙහි දක්වා ඇත. පළමු ලෝක සංග්‍රාමයේ දී අප ඒකකයේ සෙබළුන් දෙළොස් දෙනෙකු මියගොස් ඇති බව පැරණි සිහිවටන ඵලක වලින් මනාව පැහැදිලිව දක්වා ඇත.

මෙම ඉපැරණි මවු ඒකකය වන ස්වේච්ඡ ලංකා පාබල හමුදව දෙස් විදෙස් හි කරන ලද විශිෂ්ඨ සණයේ රාජකාරීන් සැළකිල්ලට ගෙන ඊට දක්වන ඉමහත් ගෞරවයක් වශයෙන් සළකා බ්‍රිතාන්‍ය මහ රජුගේ අභිමතය පරිදි 1922 මාර්තු 22 දින වේල්ස් හි එඩ්වඩ් කුමරු (පසුව හත්වන එඩ්වඩ් රජු වශයෙන් අභිෂේක ලැබුවා වූ) විසින් කොළඹ කොටුව ඇවිලන් කඳවුරු භූමියේ දී අති උත්කර්ෂවත් අන්දමින් රාජකීය සහ රෙජිමේන්තු වර්ණ ප්‍රධානය කරන ලද්දේ ය. එවකට මෙම ඒකකයේ අණදෙන නිලධාරීව සිටින ලද්දේ ලුතිනන් කර්නල් ටීජී ජයවර්ධන මැතිතුමා ය.

1939/1945 යන කාළය තුළ පැවතියා වූ දෙවන ලෝක සංග්‍රාමයේ දී මෙම ස්වේච්ඡා ලංකා පාබල හමුදව කොළඹ ප්‍රදේශය රැක ගැනීමේ රාජකාරී කටයුතුවල නිරත වූ අතර, තවත් කොටසක් ත්‍රිකුණාමල ප්‍රදේශය සහ දියතලාව රැකවරණ කටයුතුවල නියැලී ඇත.

1948 පෙබරවාරි මස 04 වන දින ලංකාව නිදහස් ඩොමිනියන් රාජ්‍යයක් බවට පත් වීමෙන් පසු 1949 ඔක්තෝබර් මස 10 වන දින අංක 17 දරණ යුධ හමුද පනත සම්මත කිරීමෙන් අනතුරුව ලංකාව තුළ නිත්‍ය හමුදවක් පිහිටුවා ගැනීමේ වරප්‍රසාදය ලැබිණි. ඉන් පසු 1950 දී ශ්‍රී ලංකා පාබල හමුදව (නිත්‍ය) ස්ථාපිත කරන ලදි. මෙම නිත්‍ය ඒකකය පළවන බළඇණිය ලංකා පාබල හමුදව වශයෙන් පිහිටුවීමෙන් පසු එතැන් පටන් මෙම ඉපැරණි ස්වේච්ඡා ලංකා පාබල හමුදව දෙවන ස්වේච්ඡා ලංකා පාබල හමුදව වශයෙන් නම් කරන ලදි. මෙම නිත්‍ය පාබල ඒකකය පිහිටුවීමේ දී ඊට අවශ්‍ය නිලධාරීන් සහ සෙසු නිලයින් මෙම දෙවන ස්වේච්ඡා ලංකා පාබල හමුදවෙන් ලබා දී ඇති අතර, එතෙක් ස්වේච්ඡා ලංකා පාබල හමුදව සතුව තිබූ තූර්ය වාදක කණ්ඩායමේ කොටසක් ද මෙම නිත්‍ය ඒකකය ගොඩනැගීමට ලබා දීමෙන් මෙම නිත්‍ය ඒකකය නගා සිටුවීමට ස්වේච්ඡා ලංකා පාබල හමුදව විශාල මෙහෙවරක් කර ඇති බැව් පෙනේ.

1881 දී බේලි විදියේ ද, ඉන් පසු 1881 මැයි මස 31 වන දින කොටුව සීමන් හොස්පිටල් ගොඩනැගිල්ලේ ද, නැවතත් 1905 අගෝස්තු මස 06 වන දින කොම්පඤ්ඤ්වීදයේ බන්ධනාගාර ගොඩනැගිල්ලේ ද, ස්ථාපිතව තිබූ මෙම ඒකකය 1951 පෙබරවාරි මස 20 වන දින කොළඹ බාලදක්‍ෂ මාවතේ පිහිටි රාජකීය කාලතුවක්කු හමුදවේ නිලධාරී නිවස්නය පිහිටුවා තිබූ දෙමහල් ගොඩනැගිල්ලට ගෙන යන ලදි. ඉන් අනතුරුව 1997 ඔක්තෝබර් මස 10 වන දින මෙම ඉපැරණි මව් ඒකකය කැළණිමුල්ලට ගෙන යන ලදි.

1954 වර්ෂයේ දී ලංකාවට සැපත් වූ එළිසබෙත් මහා රාජිනිය විසින් 1954 අප්‍රේල් මස 21 වන දින රැජිණ වර්ණ සහ රෙජිමේන්තු වර්ණ දෙවන වරටත් ගාලු මුවදොර පිටියේ පැවැති විශේෂිත වූ පිඨිකාවේ දී ප්‍රධානය කරන ලදි. 1922 දී රට යටත් විජිතයක් ව තිබූ නිසා රාජකීය වර්ණ වෙනුවට බ්‍රිතාන්‍ය ධජය පිරිනමනු ලැබුව ද, 1950 වන විට නිදහස් ලංකාවක් බවට පරිවර්ථනය වී තිබූ නිසා රැජින වර්ණ වෙනුවට ශ්‍රී ලංකා ධජය රැජින විසින් පිරිනමන ලදි. එහෙත් රෙජිමේන්තු වර්ණවල වෙනසක් සිදු නොවුවත් එහි II (දෙක) යනුවෙන් සටහන් තබන ලදි. රාජකීය වර්ණ ලබා ගැනීමේ ගෞරවය හිමි වූයේ දෙවන ස්වේච්ඡා ලංකා පාබල හමුදවට පමණි. මේ වන විට දෙවන ස්වේච්ඡා ලංකා පාබල හමුදවේ අනදෙන නිලධාරීව සිටිනලද්දේ ලුතිනන් කර්නල් ආර් කුමාරනායගම් ඊඩී, ශ්‍රීලපාහ මැතිතුමන් වේ.

1955 වර්ෂයේ මෙම දෙවන ස්වේච්ඡා ලංකා පාබල හමුදවේ "බී" කණ්ඩායම මාතර පිහිටවූ අතර, එම කණ්ඩායම ස්වේච්ඡා පුහුණු රයිපල් බළකාය වශයෙන් ඒකකයේ "සී" කණ්ඩායම නුවර පිහිට වූ අතර, එය ස්වේච්ඡා රජරට රයිපල් බළකාය වශයෙන් ද ගොඩ නගන ලදි. පසුකලෙක දී මෙම දෙවන ස්වේච්ඡා ලංකා පාබල හමුදවේ මාතර ස්ථානගතව තිබූ "බී"

කණ්ඩායම ස්වේච්ඡා ගැමුණු හේවා බළඇණිය වශයෙන් ද මහනුවර ස්ථාන ගතව තිබූ "සී" කණ්ඩායම දෙවන ස්වේච්ඡා සිංහ රෙජිමේන්තුව වශයෙන් ද නව ස්වේච්ඡා ඒකක දෙකක් පිහිටුවන ලදී.

ඒකකයට තිබූ කණ්ඩායම් දෙක අහිමි වීම නිසා නැවතත් "බී" කණ්ඩායම කළුතර ද, "සී" කණ්ඩායම ගම්පහ ද, "ඩී" කණ්ඩායම මීගමුවේද ස්ථාපිත කරන ලදී. ඉන්පසුව මෙම දෙවන ස්වේච්ඡා ලංකා පාබල හමුදවට සාමාජිකයින් බඳවා ගැනීමේ දී එම කණ්ඩායම් වලට සමීප ප්‍රදේශ වලින් සෙබළුන් බඳවා ගන්නා ලද්දේ ය. ඒ වනවිට සෙබළුන් බවා ගැනීමේ දී සිවිල් කලිසමක් හැදි කාකි කමිසයකින් (යුනිපෝම්) හා හිස් වැසුමකින් සැරසී ආචාර (සැලියුට්) කරන සෙබලකුගේ පින්තූරයක් නගර ආශ්‍රිත ප්‍රධාන ස්ථාන වල ප්‍රදර්ශනය කරන ලදී. ඉන් ගම්‍ය වනුයේ සිවිල් රැකියාවක් ඇති අයට ස්වේච්ඡා සේවයට අනුයුක්ත විය හැකි බවයි. කෙසේ නමුත් 1971 දී ඇති වූ අරගලය නිසා එම ප්‍රධාන නගරවල තිබූ මෙම ඒකකයේ "බී, සී. ඩී" යන කණ්ඩායම් බාලදක්‍ෂ මාවතේ පිහිටි ඒකක මූලස්ථානයට ගෙන යන ලදී.

1972 මැයි 22 වන දින ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත්වීම නිසා දෙවන ස්වේච්ඡා ලංකා පාබලහමුදව දෙවන ස්වේච්ඡා ශ්‍රී ලංකා පාබල හමුදව වශයෙන් නම් කරනලදී. මේ නිසා මෙතෙක් ඒකකය සතුව තිබූ රැජින වර්ණ සහ රෙජිමේන්තු වර්ණ නිර්බල වූ අතර, නිළ ඇඳුම්වලට අයත් ආයිත්තම් ද දේශීය උරුවට සකස් කරන ලද්දේය.

1978 දී නැවතත් ශ්‍රී ලංකාව ඒකීය ප්‍රජාතාන්ත්‍රික ජනරජයක් වීම නිමිති කරගෙන 1978 ඔක්තෝබර් මස 10 වන දින එවකට ජනාධිපති ජේආර් ජයවර්ධන මැතිතුමා විසින් පනාගොඩ ශ්‍රීලපාහ සරඹ භූමියේ දී ජනාධිපති වර්ණ සහ රෙජිමේන්තු වර්ණ දෙවන ස්වේච්ඡා ශ්‍රී ලංකා පාබල හමුදවට ප්‍රධානය කරන ලදී. එවකට ඒකකයේ අණදෙන ලද්දේ ලුතිතන් කර්නල් එච්බී විජේකෝන් (ඊඩී) ශ්‍රීලපාහ මැතිතුමන් විසිනි

(උපුටා ගැනීම ඓතිහාසික ලිපි ලේඛන සහ පොත්පත් ඇසුරෙනි)

1955 සිට 2001 දක්වා මෙම ඒකකයේ ව්‍යාප්තිය ඉදිරි කලාපයක පළකරනු ලැබේ

| |
|---|
| සෙ/2ඩී00135 බනි II නන්දසේන ජ්ජ්<br>2 ශ්‍රීලපාහ කිලාලී - යාපනය |

# තිලධාරී භාරදීම් / භාරගැනීම්

## රෙජිමුඛ - ශ්‍රීලපාහ



ඉහත ඡායාරූපයෙන් දැක්වෙන්නේ ඒකක අණදෙන නිලධාරීව සිටි මේජර් ජේආර් අම්පෙමොහොට්ටි, ආර්එස්පී ශ්‍රීලපාහ විසින් නව ඒකක අණදෙන නිලධාරී මේජර් එල්එම් මුදලිගේ ආර්ඩබ්පී, ආර්එස්පී, ශ්‍රීලපාහ වෙත බාරදීමෙන් පසු අත්සන් කරන අවස්ථාව



ඉහත ඡායාරූපයේ දැක්වෙන්නේ ඒකක අණදෙන නිලධාරීව සිටි මේජර් ජේආර් අම්පෙමොහොට්ටි ආර්එස්පී ශ්‍රීලපාහ හා නව ඒකක අණදෙන නිලධාරී මේජර් එල්එම් මුදලිගේ ආර්ඩබ්පී, ආර්එස්පී ශ්‍රීලපාහ වැඩ භාරගැනීමට පෙර ආගමික වතාවත් වල යෙදෙන අයුරු

# මධ්‍යස්ථාන සේනාවිධායක ශ්‍රීලපාහ ගේ රෙජි : බනි / සැර නිවස්න සංචාරය

ශ්‍රීලපාහ මධ්‍යස්ථාන සේනාවිධායක කර්නල් ආර්එම්ඩී රත්නායක, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී රෙජි: රෙ: සැ:මේ බනි 1 මේජ් කරුණාරත්න, ආර්එස්පී ගේ ආරාධනය පරිදි 2002.01.24 දින රෙම ශ්‍රීලපාහ බළලත් නිලධාරින්ගේ සහ සැරයන්වරුන්ගේ නිවස්නය සංචාරය කරන ලද අතර, රෙජි : රෙ: සැ: මේ විසින් මධ්‍යස්ථාන සේනාවිධායක තුමා ව පිළිගන්නා ලදී.

ඉන් අනතුරුව රෙජි:බනි/සැරයන් නිවස්නයේ පිළියෙළ කර තිබූ තේ පැන් සංග්‍රහය ආරාධනා පරිදි බනි/සැර නිවස්නය වෙත පැමිණ සිටි මධ්‍යස්ථාන සේනාවිධායක තුමා ඇතුළු මාණ්ඩලික නිලධාරින් අ:නි: රෙජිමුඛ සහ ඒකක පසුමූලයන්හි නි:අ: වරුන් වෙත පිළිගන්වන ලදී. ඉන් අණතුරුව රැස්ව සිටි සියළුම බනි / ජ්‍යෙකොනොනින් ඇමතූ සේනාවිධායක තුමා නිවස්නයෙන් නික්ම යන ලදී. එම අවස්ථා දක්වෙන ඡායාරූප පහත දක්වේ.



*රෙජි බනි/සැර නවස්නය වෙත පැමිණි මධ්‍යසථාන සේනාවිධායක තුමා රෙජි රෙසැමේ විසින් පිළිගත් අයුරු. රෙජි මානි 1 (පාලන) මේජර් එස්කේපීඑන්බී ඇහැලමල්පේ ආර්එස්පී ශ්‍රීලපාහ පසෙකින්*



*බනි /සැර නිවස්නයෙන් නික්ම යාමට මොහොතකට පෙර සේනාවිධායක තුමා, අමුත්තන්ගේ පොතෙහි සටහන් තබමින්*

# රෙම ශ්‍රීලපාහ තුවාක අංශය

ශ්‍රීලපාහ නිලධාරී / සෙසු නිළයින්ගේ සුභ සාධනය සඳහා රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා පාබල හමුදව,පනාගොඩ, හෝමාගම ලිපිනයෙහි පහත සඳහන් කණ්ඩායම් ස්ථාපිතකර ඇත

රෙජි තුවාක කණ්ඩායම
බියුගල් තුවාකකණ්ඩායම
අඩිරිද්ම සංගීත කණ්ඩායම
කැලිප්සෝ සංගීත කණ්ඩායම
සංස්කෘතික නැටුම්කණ්ඩායම

මෙම රෙජිමේන්තුවේ සේවයේ නියුතු නිලධාරීන්ගේ සහ සෙසුනිළයින්ගේ අවශ්‍යතාවයන් පරිදි විවිධ උත්සව සඳහා ඉහත සඳහන් සංගීත කණ්ඩායම් වල සේවය ඒ ඒ උත්සව සඳහා සුභ සාධක මිළට ලබාගත හැක. ඒ අනුව මංගල උත්සව, උපන් දින ප්‍රියසාද, විවෘත කිරීම්. පෙරහැර පිරිත් හා දනමය කටයුතු හා එළිමහන් සංදර්ශන, ගෘහස්ථ හා සංස්කෘතික අංග වශයෙන් විවිධ අවස්ථාවන් සඳහා සහභාගී කරවනු ලැබේ.

තව ද ශ්‍රීලපාහ ලහම භටයින්ටත්, වෙනත් ඒකක අයවලුන් හා යුධ හමුද භටයින්ගේ සහ සිවිල් අයවලුන්ට ද මෙම කණ්ඩායම් වල සේවය සහනදයී මිළකට ලබාදීම තවත් සුවිශේෂී කරුණකි. මෙම කණ්ඩායම් වල සංදර්ශන භාරගැනීම සිදුකරනු ලබන්නේ සේවා අවශ්‍යතාවයනට යටත්ව වන අතර යුධ හමුද මූලස්ථානයේ යොමු කිරීම මත සේවය ලබා දීම සඳහා සියළුම කණ්ඩායම් නිරන්තරයෙන් බැඳී සිටී. එකී සංගීත කණ්ඩායම් වල මිලගණන් පහත සඳහන් පරිදි වේ.

### අඩිරිද්ම සංගීත කණ්ඩායම මිළ ගණන්

| නියුතුවීම | උපරිම පැය 03 ක් සඳහා | අමතර වැඩිවන සෑම පැයක් සඳහා |
|---|---|---|
| විවාහ මංගල/උපන් දින සාද | ශබ්ද උපකරණ සමග රු. 3500/= | රු. 750/= |
| ශ්‍රීලපාහ සාමාජිකයන් සඳහා | ශබ්ද උපකරණ රහිතව රු. 2000/= | රු. 500/= |
| ශ්‍රීලපාහ නොවන ත්‍රිවිධ | ශබ්ද උපකරණ සමග රු. 4500/= | රු. 750/= |
| හමුද සාමාජිකයින් සඳහා | ශබ්ද උපකරණ රහිතව රු. 2500/= | රු. 500/= |
| ශ්‍රීලපාහ ලහම භටයින් | ශබ්ද උපකරණ සමග රු. 4000/= | රු. 750/= |
| | ශබ්ද උපකරණ රහිතව රු. 2500/= | රු. 500/= |
| යුහ නොවන අයවලුන් සඳහා | ශබ්ද උපකරණ සමග රු. 5000/- | රු. 750/- |
| | ශබ්ද උපකරණ රහිතව රු. 3500/- | රු. 500/- |
| ගෘහස්ත සංදර්ශන පුද්ගලික | ශබ්ද උපකරණ සමග රු. 10,000/= | රු. 750/= |
| ඉල්ලුම් කිරීම් මත | ශබ්ද උපකරණ රහිතව රු. 5000/= | රු. 500/= |
| එළිමහන් සංදර්ශන සඳහා | ශබ්ද උපකරණ රහිතව රු. 7500/= | රු. 500/= |

### කැලිප්සෝ සංගීත කණ්ඩායම

| නියුතුවීම | උපරිම පැය 03 ක් සඳහා | අමතර වැඩිවන සෑම පැයක් සඳහා |
|---|---|---|
| ශ්‍රීලපාහ සාමාජිකයින් සඳහා | රු. 1000.00 | රු. 25.00 |
| ශ්‍රීලපාහ නොවන ත්‍රිවිධ හමුද අයවලුන් සඳහා | රු. 1500.00 | රු. 300.00 |
| ත්‍රිවිධ හමුද නොවන සාමාජිකයන් සඳහා | රු. 2000.00 | රු. 300..00 |
| ශ්‍රීලපාහ ලහම භටයින් සඳහා | රු. 1250.00 | රු. 200.00 |

### සංස්කෘතික නැටුම් කණ්ඩායම

| නියුතුවීම | උපරිම පැය 03 ක් සඳහා | අමතර වැඩිවන සෑම පැයක් සඳහා |
|---|---|---|
| පිරිත් දනමය පිංකම සඳහා | රු. 1000/= | රු. 25/- |
| ශ්‍රීලපාහ සාමාජිකයන් සඳහා (එක් අයකුට) | රු. 75/= | රු. 25/- |
| ශ්‍රීලපාහ නොවන ත්‍රිවිධ හමුද සාමාජිකයන් සඳහා (එක් අයකුට) | රු. 150/= | රු. 25/= |
| ත්‍රිවිධ හමුද නොවන අයවලුන් සඳහා (එක් අයකුට) | රු. 200/= | රු. 25/= |
| ගෘහස්ථ එළිමහන් සංදර්ශන සඳහා (එක් අයකුට) | රු. 300/= | රු. 25/- |
| ශ්‍රීලපාහ ලහම භටයින් සඳහා (එක් අයකුට) | රු. 100/= | රු. 25/- |

තුවාක කණ්ඩායම්වල සේවාව ලබාගන්නා තැනැත්තා යාමට /ඒමට ප්‍රවාහන පහසුකම් සැපයිය යුතුයි.ප්‍රවාහන පහසුකම්සැපයීමේදී තුවාක උපකරණ සුරක්ෂිතව ප්‍රවාහනය කළහැකි වාහන ලබා දියයුතුයි. මෙම කණ්ඩායම් ලබාගැනීම සඳහා ඉල්ලුම් පත් සහ මුදල් මාස 01 කට පෙර පිටපත් දෙකකින් නිඅ තුවාක වෙත ඉදිරිපත් කළ යුතුයි. ඉන් අනතුරුව පිළිවෙළින් නිඅ පාලන රෙජි සේනාවිධායක තුමා වෙත ඉදිරිපත්කරනු ලැබේ. එය අනුමත වූ පසු ඉල්ලුම්කරු වෙනුවෙන් එම කණ්ඩායම අවශ්‍ය දිනයට වෙන්වනු ඇත.

ඒ සඳහා ඉල්ලුම්පත් සියලුම ශ්‍රීලපාහ ඒකක වෙතින් ලබා ගත හැක.



කැලිප්සෝ කණ්ඩායම



අඩිරිද්ම සංගීත කණ්ඩායම



සංස්කෘතික නැටුම් කණ්ඩායම

ලුති(උපා) ඩබ්එම් ගුණතිලක. ශ්‍රීලපාහ තුවාක භාර නිලධාරී රෙම ශ්‍රීලපාහ

# ශ්‍රීලපාහ අසනීප අංශයෙන් ඔබට වදනක්

ක්‍රියාන්විතයේදී තුවාල වී යුධ හමුද රෝහල වෙත ඉදිරිපත් කරනලද නිලධාරී / සෙනින්ගේ අසනිප තත්ත්වයන් පිළිබඳ විස්තර සහ සුවදුක් සොයා බැලීම සහ ඔවුන්ගේ ප්‍රශ්ණ සහ වෛද්‍ය නිවාඩු ලබාදීම හා ඔවුන් හට යු:ආ:වෛ: 03 පිටපත් ලබාදී යුහ රෝහල වෙත රපෝර්තු කරවීම ඇතුලු සියලු විස්තර රෙජිමේන්තු මධ්‍යස්ථාන වෙත යැවීම සඳහා ක්‍රියාන්විත අසනිප අංශය යුධ හමුද මූලස්ථානයේ මූලස්ථාන බලඇණියේ අංශයක් හැටියට පිහිටුවා ඇත.

මෙයින් වන සේවාවන් ගැන ක්‍රියාන්විතයේ සිටින නිලධාරීන් / සෙසු නිලයින් නොදන්වා විය හැක. එසේ හෙයින් ඒ ගැන වයිට් හැකල් සහරාව තුලින් හෝ ඔබ දැනුවත් කිරීම අපගේ යුතුකම ලෙස සලකමි.

මෙම අසනීප අංශය යුධ හමුද මූලස්ථානයේ මූලස්ථාන බලඇණියේ පිහිටුවා තැබීමට හේතු කාරණා බොහෝමයක් ඇත. ඒ හෙයින්, ක්‍රියාන්විතයේ දී තුවාල වී අත් පා ඇස් නොමැති සෙනීන් හට නිවාඩු ලබා ගැනීම සඳහා රෙජිමේන්තු මධ්‍යස්ථාන වෙත හෝ තම ඒකක සහ පසු මූල වෙත යාමට සිදුවී ඇති මුත් මෙම අසනිප අංශය මෙම ස්ථානයේ පිහිටා තැබීමෙන් සෙනීන්ගේ වෛද්‍ය නිවාඩු වලට බාධා අවහිර නොමැතිව නිවාඩු යාමට හැකියාව ඇත.

තව ද විවිධ හේතූන් මත අසනීප වාර්තා කිරීමට පැමිණෙන ඒකක සියල්ලන්ගේම නිලධාරී / සෙනින් හට අසනිප වාර්ථා මෙම අංශය වෙත ලබා දී තම අසනිප තත්ත්වය මත යුහ රෝහල වෙතින් වෛද්‍ය නිවාඩු ලබාදුනහොත් ඒවා ද මෙම අසනිප අංශයෙන් අනුමත කර එම ඒකකයන් වෙත සංඥ මගින් දනුම් දෙනු ලබයි. මෙම අසනිප අංශයේ ඒකක දෙකකින් පාලනමය කටයුතු සඳහා නිලධාරීන් දෙදෙනකු යොදවා ඇති අතර ජ්‍යෙෂ්ඨ කොනොතීන් සහ සෙසු නිලයින්ගෙන් සමන්විත විසිපස් දෙනෙකු පමණ විවිධ ඒකකයන් ගෙන් මෙම අංශය වෙත රාජකාරී සඳහා යොදවා ඇත.

තව ද යුධබිමේ දී තුවාල වන නිලධාරී / සෙනීන් හට ඔවුන්ගේ දෙමාපියන් ඇතුළු පවුලේ අය හට දනුම් දීම සඳහා යුධ හමුද රෝහල වෙතින් නිසි පියවරක් නොගන්නේ නම් මෙම අසනිප අංශයෙන් එම කාර්යය ද ඉටු කරනු ලබයි. ඔවුන්ගේ තවත් ප්‍රශ්ණයක් වන සිවිල් බඩු බාහිරාදිය තම ඒකක වලින් යුධ හමුද රෝහල වෙත එවීමට කටයුතු කරන විට එම සනීන් යුධ හමුද රෝහල වෙතින් නිවාඩු ලබා ගොස් සිටින්නට පුළුවන. එම අවස්ථාවේ මෙම අසනිප අංශයෙන් ඔවුන්ගේ සිවිල් බඩු බාහිරාදිය භාරගෙන මෙම අංශය වෙත සෙනී පැමිණි විට ඔවුන් හට ලබා දීමට කටයුතු කරනු ඇත.

තව ද සති අන්තයේ සෑම සිකුරාදා දිනයකම යුහ රෝහල, ජාතික රෝහල, ඇස් රෝහල, හා රාගම රෝහල් වෙත ගොස් නේවාසිකව ප්‍රතිකාර ලබන සෙනීන්ගේ විස්තර ලබාගෙන රෙජිමේන්තු මධ්‍යස්ථාන, රෙජිමුඛ හා වෛද්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පිටපත් යොද සති අන්ත වාර්තාවක් යවනු ලබයි. තව ද වෛද්‍ය නිවාඩු යන සෙනීන්ගේ සලාක වාර්ථා ද පල කිරීමට කටයුතු කරනු ලබන අතර, මෙම අංශය වෙතින් ඔවුන්ගේ පුද්ගලික ප්‍රශ්ණ ද අපහසුතාවකින් තොරව නිරවුල් කිරීමට උත්සාහ කරනු ලබයි.


**නි/63530 ලුතිනන් එම්ආර්ඩබ් සිල්වා ආර්එස්පි ශ්‍රීලපාහ ඇතුළු ශ්‍රීලපාහ සෙසු නිලයින් - අසනිප අංශය - මූලස්ථාන බලඇණිය යුහමු**


# *Once Upon a Time...*

Once upon a time there was an island where all the feelings lived, happiness, sadness, knowledge, and all the others, including love.

One day it was announced to all of the feelings that the island was going to sink to the bottom of the ocean. So all the feeling prepared their boats to leave.

Love was the only one that stayed. She wanted to preserve the island paradise until the last possible moment.

When the island was almost totally under love decided it was time to leave. She began looking for someone to ask for help. Just then richness was passing by in a grand boat. Love asked.

"Richness, Can I come with you on your boat?"

Richness answered,

"I'm sorry, there is a lot of silver and gold on my boat and there would be no room for you anywhere."

Then Love decide to ask Vanity for help who was passing in a beautiful vessel. Love cried out,

"Vanity, help me please."

"I can't help you", Vanity said, "You are all wet and will damage any beautiful boat."

Next, Love saw Sadness passing by. Love said,

"Sadness please let me go with you."

Sadness answered,

"Love, I'm sorry, but I just need to be alone now."

Then, Love saw Happiness. Love cried out,

"Happiness, please take me with you."

But Happiness was so overjoyed that he didn't hear Love calling him.

Love began to cry. Then, she hear a voice say, "Come Love, I will take you with me."

It was an elder. Love felt so blessed and overjoyed that she forgot to ask the elder his name.

When they arrived on land the elder went on his way. Love realized how much she owed the elder.

Love then found Knowledge and asked,

"Who was it that helped me?"

"It was Time", Knowledge answered.

"But why did Time help me when no one else would?" Love asked.

Knowledge smiled and with deep wisdom and sincerity, answered.

"Because only time is capable of understanding how great Love is."


**LT. A U K G YATAGAMA SLLI**
**RANAWIRU WELFARE SECTION,**
**REGIMENTAL CENTER,**
**PANAGODA, HOMAGAMA.**



3 ශ්‍රීලපාහ ඒකකයට අයත් මියගිය සෙ/303750 ලාකෝ දසනායක ආර්පීඩබ් වෙනුවෙන් ඔහුගේ දෙමාපියන් විසින් බද්දේගම පාසල් භූමියේ ඉදිරිකරන ලද බුදු මැදුරේ ඡායාරූපය

ලාකෝ දසනායක ආර්පීඩබ් සිහිවීම පිණිස ඉදිකර ඇති ස්මාරකය



# නිවන් දකින්නට මේ පිංකම ඇති මතු භවයේදීත් රත්තරන් පුතේ

සෙ/303750 ලාකෝ දසනායක ආර්පීඩබ් යන කොමිෂන් නොලත් නිලධාරි 1992.06.18 දින ශ්‍රී ලංකා යුධ හමුදවට බැදී ආධුනික පුහුණුව රෙජිමේන්තු මධ්‍යස්තානය ශ්‍රීලපාහ අංක 11 යටතේ පුහුණුවීමෙන් පසු 1992.09.01වන දින 3 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදව වෙත ඇතුලත් කරන ලදි. එතැන් පටන් ඒකකයේ සියලුම නිළධාරි/ සෙසුනිලයන් සමග එකට එක්වී සියලු දෙනාගේම සිත් දිනාගෙන ඒකකය විසින් සිදුකරන ලද පුහුණුවීම් කටයුතු මෙන්ම ඔහු හට හිමි වූ සියලුම රාජකාරින් ඉතාමත් උනන්දුවෙන් හා මනා කැපවීමකින් ඉටු කරමින් මිලේච්ජ ත්‍රස්තවාදීන්ට එරෙහිව ශ්‍රී ලංකා යුද හමුදව විසින් සිදු කරන ලද ග්‍රීන් බෙල්ට්, යාල්දේවි, රිවිරැස, රෝයල් ෆලෂ්, සත්ජය II සත්ජය III, එඩිබලය යන දැවැන්ත ක්‍රියාන්විතයන්ට එඩිතරව මුහුණ දෙමින් සිටිය දි මහනුවර, යාපනය ප්‍රධා මාර්ගය ත්‍රස්තවාදීන්ගේ මුදවා ගැනීම සඳහා යුධ හමුදව විසින් සිදුකරනලද ජය සිකුරු ක්‍රියාන්විතයට සහභාගී වී සිටිය දී 1997.09.11 වන දින ත්‍රස්තවාදීන් විසින් එල්ල කරන ලද ප්‍රහාරයකදී ජීවිතක්ෂයට පත්වන ලදී.

දේශයට අහිමි වූ මෙම සහෝදර සෙබල සොයුරාගෙන් රට ජාතියට ඉටු වූ සේවය ඉමහත්ය. මෙවැනි විරපුතුන් මේ මිහිතලයෙන් සමු ගැනීම තමා හද වඩාගත් මාපිය සහෝදර සහෝදරියන්ට මෙන්ම ඒකකයටත් ශ්‍රී ලංකා යුධ හමුදවටත් මුළු මහත් ශ්‍රී ලංකා වාසී සැමටත් දරාගත නොහැකි වූ පාඩුවකි. දේශයට අහිමිවූ මෙම සහෝදර සෙබල සොයුරා වෙනුවෙන් ඔහුගේ මාපිය යුවල උදර වූ පරිත්‍යාගයකට දයකවිය තම ආදරණීය පුතු මිය ගියේ ඒකීය ශ්‍රී ලංකාවක් පිහිටුවීමේ කාර්‍යයේ නිරතව සිටියදී ය. එම මා පිය යුවලට තම පුතු අහිමි වුව ද එම දෙපලගේ මාපිය සෙනෙහස කිසිදු අයුරකින් නොවෙනස්ව ඇත. ඒ ආදරණීය මව්පිය සෙනෙහස ලැමැද හොවාගෙන තම මිය ගිය ආදරණීය පුතු හට උතුම් වූ පුණ්‍ය කර්මයක් ලබාදිම සඳහා මහනුවර බැද්දේගම පාසල් භූමියේ බුදු මැදුරක් ස්ථාපනය කර එම පාසලේ අධ්‍යාපනය ලබන සිසු දරුවන් වෙනුවෙන් පරිත්‍යාග කරන ලදී.

දසනායක විරුවා මෙලොවට බිහි කළ එම මාපිය දෙපළට මෙම ලිපිය උපහාරයක් වේවා

**සෙ/300523 සැරයන් කීර්තිසිංහ කේපී**
බුද්ධි අංශය - **3 ශ්‍රීලපාහ**
වාවකච්චේරි - යාපනය

# "මොරටු පුරවරයෙන් වීර සෙබළ සත්කාරයක්"





දිනය 2001 ක් වූ උඳුවප් මස 03 දින සන්ධ්‍යා කාලයයි. මෙම දින විශේෂිත දිනයක් වූයේ 2001 බක් මස 25 වනදින උතුරු යුධ බිමේ වාර්ගවාදී ම්ලේච්ඡ කොටි ත්‍රස්තවාදීන්ට එරෙහිව සිදුකරන ලද "අග්නිඛීල" ක්‍රියාන්විතයේ දී රුදුරු පුද්ගල නාශක බෝම්බයකට අසුව තම සොඳුරු යෞවනයේ වටිනාම දයාදයක් වූ තම පාදය රට දැය වෙනුවෙන් පූජා කළ අභීත රණවිරුවන් තිදෙනෙකුට කෘතිම පාද ප්‍රධානය කිරීමයි.

යුධ හමුද ක්‍රියාන්විත ඉතිහාසයේ සුවිශේෂ ස්ථානයක් හිමිකරගෙන සිටින ගුවන් සංක්‍රමික බළසේනාවේ 3 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදව 2001 බක් මස 25 වන දින කිලාලි ඉදිරි ආරක්‍ෂක වළල්ලෙන් ඉදිරියට සිදු කරන ලද "අග්නිඛීල ක්‍රියාන්විතය සඳහා සහභාගී විය. මෙහි අරමුණ වූයේ පලෙයි නගරය අත්පත් කර ගැනීමවිය. ක්‍රියාන්විතයේ අරමුණ මුදුන්පත් කර ගැනීම වස්, ජීවිත පරිත්‍යාගයෙන්, අධිෂ්ඨාන පූර්වකව සතුරු බාධක බිඳදමමින් ඉදිරියට ඇදුණු භට පිරිස් ත්‍රස්තවාදීන්ගෙ 'බිම් වෙඩි කෙතකට හසු විය. එහි දී අප සොල්දදුවන් විශාලප්‍රමාණයකගේ පාද අහිමි විය.

තාරුණ්‍යයේ සුවහසක් පැතුම් එලෙස අකාලයේ බොඳ වී යද්දී යළිදු වතාවක් දෙපයින් නැගී සිටීමට දේශය වෙනුවෙන් කලා වූ උතුම් මෙහෙය විශිෂ්ඨ වූ පරිත්‍යාගය අගය කිරීම වස්, මොරටු පුරවරයෙන් දේශයට හිතැති තරුණ සිත් හඳුනාගත් දෙමාපිය /සොහොයුරන් විසින් ආබාදිත රණවිරුවන් තිදෙනෙකුට හිත සුව පිණිස එක් පාදයක් රු. 15,000.00 වටිනාකමින් යුතු කෘතිම පාද තුනක් පිරිනමන ලදී. එම පාද පහත දක්වා ඇති රණවිරුවන් වෙත "සී" කණ්ඩායම 3 ශ්‍රීලපාහ සැරයන් මේජර් ව/සැරයන් ප්‍රනාන්දු එම්බීපීඑල් ගේ මොරටුව කල්දෙමුල්ල සුධර්මාරාම පාර අංක 17/10 දරණ නිවසේ දී ආගමික වතාවත් මැද වාම් උත්සවයකින් පසු ඔවුන්ගේ ප්‍රයෝජනය සඳහා ප්‍රධානය කරනලදී.

| **මේ සඳහා බර පැන යෙදවුවන්** | **පාද ලැබුවන්** |
|---|---|
| ඩී.ඒ ආර් ජයවර්ධන මහත්මිය,<br>නො, 47/18, තෙලවල පාර,<br>ගල්කිස්ස | සෙ/276040 ආසෙ ජයලාල් එස්ඩීඑස් |
| ඒ ඒ තිලකරත්න මැතිතුමා<br>කළමනාකාර අධ්‍යක්‍ෂ<br>තිලක එන්ටර්ප්‍රයිසස් (පුද්ගලික) සමාගම<br>රාවතාවත්ත , මොරටුව | සෙ/303119 කෝප්‍රල් දිසානායක ඒඩීඑන්ඩී |
| අතුල පිරිස් මහතා<br>දේශාන් ෆැසන් ටේලර්<br>නො: 108, ගොලුමඩම හන්දිය<br>රත්මලාන | සෙ/271903 ආසෙ නන්දවීර කේපීඩී |

**සෙ/14502 සැරයන් චන්ද්‍රසිරි කේඑස් (කෘ:උ:පා:සැ)**
**3 ශ්‍රීලපාහ "සී" කණ්ඩායම ගුවන් සංග්‍රමික බළසේනාව. වාවකච්චේරිය - යාපනය**

# මංගල සීනු...



2001-11-22 වන දින කපිතන් කේ එල් එස් එස් ලියනගම ආර්එස්පී ශ්‍රීලපාහ බේරුවල ක්ලබ් ෆාම් ගාර්ඩන් හෝටලයේදී නිර්මාණී කාංචනා කරුණාරත්න මෙනෙවිය සමග විවාහ වන ලදී.



කපිතන් වී ජී ඩී බී හේවාවිස්ස ආර්එස්පී ශ්‍රීලපාහ සාන්ධ්‍ය කුමාරි ගමගේ මෙනවිය සමග 2001-09-27 වන දින නුවර අර්ල්ස් රිජෙන්ස් හෝටලයේදී විවාහ වන ලදී.



2(සෙවි) ශ්‍රීලපාහ ඒකකයේ සෙ/2ඩී01157 සැරයන් අබේනායක ආර් එම් එන් මැදිරිගිරිය අඹගස්වැව මැණිකේ අඹගහවත්ත මෙනවිය සමග 2001-10-29 වන දින නිවසේදී විවාහ වන ලදී.





සෙ/309979 සාසෙ ප්‍රියන්ත ජී 2001-10-19 වන දින ජී ජී චම්පා කුමාරි මෙනෙවිය සමග කොස්ගම වෙල්සියා රෙස්ටුරන්ට් හිදි විවාහ ගිවිස ගන්නා ලදී.

6 ශ්‍රීලපාහ සෙ/305085 කෝප්‍රල් ගුණසේකර කේ ජී එන් 2001-08-24 වන දින දේවමුණි සුරංගිකා දමයන්ති මෙනෙවිය සමග අතිනත ගත් අවස්ථාව





සෙ/2ඩී02817 සාසෙ විජේසිංහ ඩබ් පී එස් 2001-05-20 වන දින බී ජී මංගලිකා සමරකෝන් මෙනෙවිය සමග විවාහ වන ලදී.

සෙ/14ඩී00137 සාසෙ පියතිස්ස කුමාර පී එම් , 2001-03-08 වන දින රුක්ෂිලා කුමාරි මෙනෙවිය සමග කොබෙයිගනේ විවාහ ලේකම් කාර්යාලයේදී විවාහ වන ලදී.





සෙ/308720 ලාන්ස් කෝප්‍රල් කරුණාදස එච් කේ, 2002-01-25 වන දින ඊ එම් චාමරී ප්‍රසන්තිකා මෙනෙවිය සමග මනාලියගේ නිවසේ දී විවාහ වන ලදී.

1 ශ්‍රීලපාහ ඒකකයේ සෙ/301674 ලා/කෝ ජයන්ත කේ එච් ඩී පී 2001-07-28 වන දින බිබිල මැදගම කාන්ති රාජපක්ෂ මෙනෙවිය සමග මනාලියගේ නිවසේදී විවාහ වන ලදී.

# සැබෑ සිහිනය



සැන්ද අහසේ රන්වන් පාට කෙමින් කෙමින් මැකී ගොම්මන්කළුවර කඩා හැලුනේය. රාත්‍රි ආහාරය පිළියෙළ කළ සිරියාවතී තම නිවසේ මුල්ලක හේත්තු කර තිබූ පැදුරු කැබැල්ල අතට ගෙන ගොම මැටි ගෑ වටපිල මත එළුවේ ය. කුප්පි ලාම්පුව අතකට ගත් සිරියාවතී එය කනප්පුව මත තබා වාඩි විය. විට මල්ල අතටගත් සිරියාවතී පුවක් පෙති කිපයක් හීනියට ලියා කටේ ඔබා ගත්තේය. කීප වරක් උගුරේ රැල් බුරුල්කල සිරියාති මිදුලට කෙල ගැසීය. පිල් කණුවට බර දී හාන්සි වූ සිරියාවතීට නින්ද ගියේ ය. මෙසේ හෝරා කීපයක් ගෙවී ගොස් රෑ මැදියම ද ළං වෙමින් තිබුණේ ය. සුපුරුදුපරිදි සුරාපානය කළ හේතුහාමි මහ හඬින් ගීයක් ගයාගෙන හතරගාතෙන්ම තම නිවස දෙසට ළඟා වෙමින් සිටියේය.

ඔබ එනවා බලා පැල්පතට වෙලා....

මම හිටියෙ උදේ ඔබ කොහෙද ගියේ...

ඒ සුමිහිරි ගී නාදය කන් සිදුරුකරගෙන යනවාසේ දැනුන නිද සිටි සිරියාවතී සෙමින් හිස හරවා හේතු හාමි එන විලාසය දෙස බලා සිටියේ ය. සුරාමතින් සිටි හේතුහාමි දුක සිරියාවතිට අංශක අනුවටම කේන්ති ගියේ ය.

හ...හ් උදේ ඉඳන් හරිහම්බ කරන මුදල් හැමදම තැබෑරුමට පූජා කරලා ගෙදර හතර ගාතෙන් ද එන්නේ ඕයි. හැබෑට තමුසෙට ලැජ්ජා නැද්ද.. මේ පොඩි කොලුවා හිටියේ නැත්නම් මම දන්නවා තමුසෙට කරන්න ඕන එක. තමුසෙත් එක්ක දීග ආවාට වඩා හොඳයි පඹයෙක් එක්ක ගියානම්....

එසේ කියූ සිරියාවතී ගෙතුලට රිංගා දඩාස් ගාලා දෙර වැසීය. තම බිරිඳගේ වදන් වලින් හිත කල කිරුණු හේතුහාමි පිල්කඩ මත තිබූ පැදුරුකැල්ලේ හාන්සි වී කල්පනා කරන්න විය. හැමදම මේ වචනවලින් සංග්‍රාහ ලබන හේතුහාමිගේ සිත සිරියාවති කෙරෙහි කල කිරෙන්නට විය. තම බිරිඳට හොඳ පාඩමක් උගන්වන්නේ කෙසේ දැයි සිතූ හේතු හාමිට වෙරිමරගාතෙම නින්ද ගියේ ය. උදේ පාන්දරින්ම පිපිදුනු හේතුහාමි වසා ඇති දෙර අඩක් විවර කර තම බිරිඳ දෙස බැලීය. ගෙයිතුල දල්වෙන කුප්පි ලාම්පු ආලෝකයෙන් සිරියාවතීගේ මුහුණ පුර හඳක්සේ දිස්විය. බොහෝම ශෝකයෙන් යුතුව ඒ දසුනෙන් ඇස් ඉවතගත් හේතු හාමි නිද සිටි තම පුතාට කතා කර මෙසේ කීවේය.

"පුතේ මට තවත් මේ ගිහිගෙයි විසීම දුකයි එමනිසා මම මේ ගිහිගෙය අතහැර මහ වන මැදට ගොස් තපස් රකිනවා උඹ අම්මත් එකක් ජීවත් වෙයන්.

එතකොට මටයි අම්මාටයි යන කල දසාව මොකක්ද තාතේතේ. යකෝ වෙස්සන්තර දරුවෝ දන්දුන්නාලු එහු එකේ උඹලාත් ගහක පොත්තක්හරි කාලා ජීවත් වෙයල්ලා..

එසේ කියූ හේතුහාමි ගෙයි මුල්ලේ තිබූ කැති කොටයක් අතට ගෙන මිදුලට බැස්සේය. තාත්තා යනවා නම් මාත් එනවා කියූ පුතා හේතුහාමිගේ අතේ එල්ලුනේ ය. මොහොතක් කල්පනා කළ හේතුහාමි දෙන්නා යන ගමන අසුභ බව පවසා වත්තේ කොස් ගසේ බැඳදමා හිටි ගෙන්වස්සා ද එම ගමනට හවුල්කර ගත්තාය. මෙම කිසිවක් නොදත් සිරියාවතී තද නින්දේ පසුවිය. මහ වනයක් මැද්දෙන් ගමන්කළ මෙම තිදෙනා තමන් ඉදිරියේ ඇති ගඟක් දුක හේතු හාමි තම පුතාට මෙසේ කීවේය. පුතේ නේරංජලා ගඟ නම් හමුවුනා එතර වෙන්නට කන්තක අශ්වයකු තමයි නැත්තේ කියා වට පිට බැලූ හේතුහාමි තම පුතා ඔසවා හරකාගේ පිට උඩ තබා හේතුහාමි ද පිට උඩ නැග ගොන්වස්සාට අතේ තිබූ කැති කොටෙන් තැලීය. පහර කෑම ඉවසාගත නොහැකිව ගොන්වස්සා ගඟට පැන්නේ හීයක වේගයෙන් ය. ගඟේ සැඩ පහරට අසුවී තිදෙනාම ගඟගෙන යන්නට විය. ගංඉවුරේ තිබූ වැල්පොටක එල්ලී යාන්තමින් දිවිගලවා ගත් තාත්තයි පුතායි ගොඩට ආවේ ගොන් වස්සා ගැන දුක කියමිනි. ගං ඉවුරෙදි තිබූ නුග ගසක් මුල වාඩිවුණු හේතුහාමි තම පුතාට මෙසේ කීවේය. පුතේ උඹ ගෙදර ගිහින් අම්මාට කියාපන් තාත්තා මහ වන මැද තපස් රකිනවා ගොන්වස්සා ඒ සොවින් පපුව පැලිලා මැරුනා කියලා. තාත්තාගේ මහනකම් මට වැඩක් නැහැයි සිතූ පුතා නිවස බලා ආපසු ගියේය. බොහෝ විඩාවට පත් හේතු හාමි ට යකෙක් කන්න තරම් කුස ගිනි වී සිටියේ ය.

මේ අතර තුර ගඟ අවටින් ඇති අඩි පාර දිගේ කෑම පෙට්ටියක් හිස මත තබාගෙන කාන්තාවක් දුක සුජාතා දේවිය කිරිපිඩු දනය ගේනවායැයි සිතා කෙල

පෙරාගෙන සමාධි සුවයෙන් වැඩ සිටියේය. එම කාන්තාව වෙනතක යනවා දුටු හේතු හාමිට මාව දැක්කේ නැතුව වෙන්දැයි සිතා මම මෙහේ කියාගෙන එම කාන්තාව ඉදිරියට පැන කෑම පෙට්ටිය උදුරා ගත්තේය. බියට පත් කාන්තාව පසු පස නොබලාම දිව ගියාය. කෑම පෙට්ටිය නුග ගහ අසල තබා කැත්ත අතට ගත් හේතුහාමි තම හිස කෙස් ඉහළට ඔසවා අල්ලා කෙස් මිටක් කපා අතට ගෙන මම ඒකාන්තයෙන්ම බුදුවෙනවා නම් මේ කෙස් මිට දෙවියන් විසින් දිව්‍ය ලෝකයට රැගෙන යා යුතුයි කියා ප්‍රාර්ථා කර ඉහළට විසිකළේය. කෙස් මිට ඉහළ ගොස් එරමිනියා අත්තක පැටලුනේ හේතුහාමිට සොයා ගැනීමට අපහසු වන ලෙසටය. එයින් සතුටු වුනු හේතු හාමි පෙට්ටිය තුළ තිබූ ආහාර වළඳ එහි තිබූ කෙසෙල් කොලයක් අතට ගෙන මෙසේ සිතුහ. මම ඒකාන්තයෙන්ම බුදුවෙනවා නම් මෙම කෙසෙල් කොලය ගඟේ උඩු අතට පාවිය යුතුය කියාය. ගඟට දැමූ කෙසෙල් කොලය මාලුවෙකු විසින් ඉහළට ඇදගෙන ගියේ හේතුහාමි පුදුමයට පත් කරවමිනි. හිටිහැටියේම ඉතාමත් බිහිසුණු ශබ්දයක් ඇසී හේතුහාමි පස්ස බැලීය. කැති පොලු අරන් මහ සෙනඟක් තමා දෙසට එන දුටු හේතුහාමිට දවල් තරු පෙනුනේය. දසමාර බිම්බර සේනාව තමාව මරන්න එන්නේ යැයි සිතූ හේතු හාමි වෙඩි වැදුනු ඌරකු පරිද්දෙන් ගෙදර දිව්වේ ය.

ඕ.... යි තමුසේ තවත් නිදිද, ඉරත් පායලා මේ කහට වතුර ටික බීලා ගේනට ගිහින් එනවා. වට පිට බලා ඇස් දෙතුන් පාරක් පිස දැමූ හේතුහාමි දුටුවේ අපූරු දර්ශනයකි. මෙන්න බොලේ ගහේ ගහගෙන ගිය ගොන්වස්සා මිදුලේ කොස්ගසේ බැඳ දමා ඉන්නවා. හේතුහාමිට පස්සේ ගත්ත ටික වැඩිවුනාට හීනෙන් ඉගෙන ගත් පාඩම නම් සැබෑ සිහිනයක් විය.

නිමි.

සෙ/9ඩී00281
ලාකෝ දිසානායක ඩීඑම්ආර්
9 ශ්‍රීලපාහ
මූලස්ථානය මාතිපායි - යාපනය

# History of the Army Cantonment Panagoda

## HISTORY IN BRIEF

- In January 1950, 350 acres of land was purchased in Homagama.
- In Feberuary 1950, Brigadier Harold E Moor of British Army had arrived to advice on the construction of an Army Cantonment in Homagama.
- On 10th October 1952, the Foundation Stone was laid by the Honourable Prime Minister Dudley Senanayake
- On 22nd October 1959, the main building was declared opened by the Honorable Prime Minister W Dhanayake.
- On 8th December 1952, Colonel A M Muthukumaru was appointed as Officer Commanding Troops Panagoda.
- In 1968, the establishment by the name of Army Force, Panagoda. Was formed by Colonel PD Ramanayake
- In 1972, the Western Command was formed by Colonel CT Caldera
- in 1978, Support Force was formed by Brigadier SC Ranathunge
- On 4th April 1988, Headquarters 1 Division was established by Major General SMA Jayawardana.
- On 15 July 1997, 1 Division was renamed as headquarters II Division and Commanded by Major General WAA de Silva RSP USP

COMPLIED BY
COL AMB PEIRIS RWP
COL GS II DIV

# අතීතයෙන් ඔබට

- ක්‍රි.ව. 1815 දී මුළු ශ්‍රී ලංකාවම බ්‍රිතාන්‍ය බලය යටතට පැමිණියේ ය
- ක්‍රි.පූ. 543 දී බුදුරජුන් කුසිනාරා නුවර මල්ල රජදරුවන්ගේ උයනේ යමක ශාලා වෘක්ෂයන් අතර පනවන ලද යහනක පිරිනිවන් පෑ සේක
- විජයකුමරු 700 ක් දෙනා සමග තම්බපන්නියෙන් ශ්‍රී ලංකාවට ගොඩ බැස්සේ බුදුරජුන් පිරිනිවන් පෑ දිනයේම යැයි ඉතිහාසඥයෝ කියති.
- සර් ජොන් කෝඩ් (Sir Jhon Code) මහතාගේ මග පෙන්වීම යටතේ කොළඹ නැව්තොටේ මුහුදු ගෙය (දිය කඩනය) ගොඩනැගීමේ වැඩ පටන් ගැනින. සත්වන එඩ්වඩ් (Ed–rd VII) රජතුමා කාලයේ දී 1875 දී එයට මුල්ගල තබන ලදී.
- වර්ෂ 1893 දී අත් එන්නත් ක්‍රමය ඉංග්‍රීසින් විසින් ශ්‍රී ලංකාවට ගෙනෙන ලදී.
- අනගාරික ධර්මපාලතුමා නිදහස පිළිබඳ උද්ඝෝෂණ අරඹන ලද්දේ ක්‍රි. ව. 1912 දී ය.
- 1807 දී ප්‍රංශ හමුදව විසින් පෘතුගාලය ආක්‍රමනයකල අතර රජ පවුල අත්ලන්තික් සාගරය හරහා බ්‍රසීලයට යාත්‍රා කලේය

(උපුටා ගැනීමක්)

2/ලුති සම්පත් ද සිල්වා
9 ශ්‍රීලපාහ බී කණ්ඩායම

# ලෝකයේ පැරණිතම සමූහාණ්ඩු රාජ්‍යය

ක්‍රිස්තු පූර්ව 6 වන සියවස වන විට දඹදිව ප්‍රධාන රාජ්‍ය 4 කින් සහ තවත් සමූහාණ්ඩු කිහිපයකින් ද සමන්විත විය. මහාචාර්ය ඒ. එල් බෂම් ගේ (ඕස්ට්‍රේලියානු ජාතික විශ්ව විද්‍යාලයේ මානව ශාස්ත්‍ර අධ්‍යාපන පීඨයේ හිටපු මහාචාර්ය) අදහස පරිදි ලොව පැරණිතම සමූහාණ්ඩු පාලන ක්‍රමය පැවතුණේ එකල භාරතයේ වජ්ජී රාජ්‍යයේය.

ඉතිහාසයේ සඳහන් වන අන්දමට පැරණි වජ්ජී රාජ්‍යය ක්‍ෂත්‍රිය වංශ 8 ක් විසින් ප්‍රදේශ 8 කට බෙද පාලනය කරන ලදී. එයින් වජ් ජී, විදේශ, ලිච්ඡවි සහ නාතික යන වංශ 4 ප්‍රසිද්ධ තිබෙන අතර අනෙක් වංශ 4 පිළිබඳ පැහැදිලි තොරතුරු නැත. පැරනි වජ්ජී සමූහාණ්ඩුවේ සීමාවක් ද මෙතෙක් සොයාගෙන නොමැත.

විශාලා මහනුවර අගනුවර කොටගත් ලිච්ඡවි රජවරු 7707 ක් විසින් ගෙන ගිය පාලනයට බුදුදහමේ ආභාෂය ඉතා ප්‍රබල ලෙමස ලැබුණු බව බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ. බුදුදහමේ දක්වෙන සප්ත අපරිහානි ධර්ම, දස රාජ ධර්ම, සතර සංග්‍රහ වස්තු යන බෞද්ධ පාලන ප්‍රතිපත්ති වල ආභාෂය උසස් ලෙස ලබමින් ඉතාම ධාර්මික පාලනයක් ලිච්ඡවි රජවරුන් විසින් ගෙන යන ලදී. බුද්ධ වර්ෂ 2015 දී වීදගම මෛත්‍රිය හිමියන් විසින් රචිත බුදුගුණ අලංකාරයේ ලිච්ඡවි රජවරුන්ගේ දැහැමි පාලනය කාව්‍යයෙන් ඉදිරිපත් කොට තිබේ. එයින් සමහරක් මෙසේ ය.

සක බිම පෙරළෙ මින්  
ගැල බඩු නිසල කෙරෙ මින්  
පවතින මෙන් නො මින්  
තුමුදුක් විඳිත් සත රකි මින්

කරත්ත රෝදය බිම පෙරළෙමින් යන අතර එහි බඩු නොසැලී තිබෙන්නාක් මෙන් ඒ රජවරු සත්වයන් ආරක්‍ෂා කරන අතරම ඒ සඳහා ඔවුහු බොහෝ දුක් විඳිති.

රොන් අරගෙන සෙමින්  
යන බිඟු ලෙසින් කුසු මින්  
ලොවට දුක් නොදෙ මින්  
ගනිති අය පඬුරු පෙර තිය මින්

මල් වලින් ප්‍රවේශමින් පැණි ගන්නා මී මැස්සන් මෙන් ඒ රජවරු ජනතාවට හිරිහැරයක් නොවන පරිද්දෙන් පුරාණ නීතිවලට අනුව අය බදු ලබා ගනිති.

ගමන පවනක් සේ  
ගවර වල පුල් සර සේ  
තුනුක-ලන් දෙසේ  
සමව පවතින සිතින් සොඳ සේ

කුණු දමන වළෙහි ද මල් පිපුණු විලෙහි ද සමසේ හමා යන සුළඟක් ලෙසින් ඔවුහු කුලීනයන් කෙරෙහි ද කුලහීනයන් කෙරෙහි ද ඉතා හොඳින් සම සිත් .දරති.

දත් මැදලා දම න  
දැහැටි අඩු මෙන් දින දින  
මෙහෙ ගෙන දනන් ගෙන  
පසුව නොදමති නොදනන් මෙන

දත් මැදීමෙන් පසු දිනක් පාසා ඉවතලන. දත් මැදීමට ගන්නා කෝටුව මෙන් ජනයාගෙන් වැඩකරවා ගත් පසු ඔවුන් නොහඳුනන ලෙසට අමතක කර නොදමති

ඇතු රකිනා පිණ ස  
දලාන අනුන් සස් ලෙස  
එකකුට වැඩ පිණි ස  
නොදෙති උදුරා එකකුගේ යස

ඇතු පෝෂණය කිරීම සඳහා අනුන්ගේ බෝග කපා හෙළන්නාක් මෙන් එක් අයෙකුගේ අභිවෘද්ධිය සඳහා තවත් අයෙකුගේ සම්පත් උදුරා නොදෙති.

මල සිඳෙන පමණ ට  
දවන රන් සේ ගිනි කොට  
කළ වරද පම ණට  
දෙවෙනි සන්තාප ඔහු දන හට

කුණු පිළිස්සෙන තරමට පමණක් ගිනියම් කොට රත්රන් දවාලන්නාක් මෙන් ඒ රජවරු කරන ලද වරදේ ප්‍රමාණයට පමණක් ජනතාවට දඬුවම් පමුණුවති.

නුවර රැකවර ණට  
කරන පවුරෙහි හිර කොට  
ලොවට රැකවර ණට  
තබා තරකොට ගනිති ඇති විට

නගරයේ ආරක්‍ෂාව සඳහා ස්ථිර ලෙස තතන ප්‍රාකාරය මෙන් ලෝකයාගේ ආරක්‍ෂාව සඳහා ඒ රජවරු හැමවිටම ස්පිරසාරව සිටිති.

විශාලා මහනුවර පැවැති කූඨාගාර නමැති ශාලාවට රැස්වී පාලන කටයුතු ගෙන ගිය ලිච්ඡවී රජවරුන්ගේ පාලනය වර්තමානයේ ක්‍රියාත්මක වන ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමයට බොහෝ සමානාත්වයක් දරණ බව උගතුන්ගේ මතයයි. සම්මත සීමාවක, සම්මත කාල සීමාවක රැස්වීම, රැස්වීම් නිත්‍යානුකූල වට තුනෙන් දෙකක ගණ පූර්ණයක් තිබිය යුතු වීම, කථානායක වරයෙකු පත්වී සිටීම, ලේකම්වරයෙකු පත්වී සිටීම, පනතක් සම්මත කර ගැනීමට පෙර තුන්වරක් කියවීම, ඡන්ද ක්‍රම පැවැතීම, ඡන්ද විමසීම් කටයුතු භාරව නිලධාරියෙකු සිටීම සහ සාධාරණ අධිකරණ ක්‍රමයක් පැවැතීම යනාදිය විශේෂයෙන් කැපී පෙනේ.

වර්තමානයේ මුශාෆර්පූර් දිස්ත්‍රික්කයේ පිහිටි බෙසාර් නමැති ග්‍රාමය හා ඒ අවට ප්‍රදේශය පැරණි විශාලා මහනුවර වයෙන් පුරා විද්‍යාඥ ජෙනරාල් කනිංහැම් මහතා හා වෙනත් පුරා විද්‍යාඥයන් විසින් හඳුන්වනු ලබන අතර ලිච්ඡවී රජවරු රැස්වූ කූටාගාර ශාලාව විශාලා මහනුවරට සැතපුමක් පමණ බටහිරින් පිහිටි මහ වනයේ පිහිටා තිබුණු බව පැවසේ.

කනිංහැම් මහතා ප්‍රකාශ කරන අන්දමට වර්තමානයේ බෙසාර් නගරයට සැතපුම් 2 ක් පමණ වයඹ දිගින් පිහිටි බබ්රා නමැති ගමේ පිහිටි රාම්කුණ්ඩ නමැති විලේ ඉවුර හැරීමේ දී හමුවූ ගරා වැටුණු බිත්තිය පැරණි කූටාගාර ශාලාවට අයත්ය.

එහෙත් පුරාවිද්‍යාවේදී ආචාර්ය වින්සන්ට් ඒ ස්මිත් මහත මීට තරමක් වෙනස් අදහසක් ඉදිරිපත් කරන අතර ඔහුගේ මතය නම් බබ්රා නමැති වයඹ දිගින් පිහිටි කොල්ලුවා නමැති ග්‍රාමයේ නැගෙනහිර ප්‍රදේශයේ ඉන්ඩිගෝ වැවීම සඳහා භූමියක් සකස් කිරීමේ දී හමුවූ පැරණි ගඩොල් හා පැරණි ගොඩනැගිලි රාශියක නටඹුන් කූටාගාර ශාලාව පිහිටි ස්ථානය සලකුණු කරන බවයි.

එයට ද වෙනස් අදහසක් පුරා විද්‍යාඥ බාබු පී. සී මුඛර්ජි මහතා ඉදිරිපත් කරයි. වර්තමාන බෙයාර් නගරයට සැතපුම් 1 1/2 පමණ උතුරෙන් පිහිටි උස් භූමිය කූටාගාර ශාලාව පිහිටි ස්ථානය බව ඔහුගේ අදහසයි.

ලුතිනන් තරිඳු වීරසිංහ - 2 ශ්‍රීලපාහ  
21 ශ්‍රීලංජාආබමූ  
216 බසේම, ගජසිංහපුර වෙඩ්ඩිකුලම

# මියගිය අතුරුදහන්වූ රණවිරුවන් සැමරීම - මධ්‍යම පළාත

1 මෙම ශ්‍රී ලංකා පාබල හමුද රෙජිමේන්තු මධ්‍යස්ථානයට අයත් ශ්‍රීලපාහ ඒකකයන් සමගින් ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී ත්‍රස්තවාදී ප්‍රහාර හේතුවෙන් මියගිය / අතුරුදහන්වූ අයවළුන්ගේ පවුල් වල සාමාජිකයින් ඒ ඒ පළාත් අනුව වෙන්කර එක් එක් පළාත් වලට ආවේණික වූ දිස්ත්‍රික්කය බෞද්ධ /ක්‍රිස්තියානි/ හින්දු මධ්‍යස්ථානයක් වෙත කැඳවා මියගිය / අතුරුදහන්වූ අයවළුන් වෙනුවෙන් පිං පමුණුවා පිංකම් කටයුතු සිදු කිරීමට කටයුතු සැලසුම් කර ඇති අතර,එහි පළමු අධියර ක්‍රියාවට නංවාලීම වස් මධ්‍යම පළාතට සාපේක්ෂ වූ මියගිය / අතුරුදහන් වූ රණවිරුවන්ගේ ඥාතීන් කැඳවා පුන්‍ය කර්ම කටයුතු සිදු කිරීමට ක්‍රියා කරමින් සිටී

තව ද එම පුණ්‍යකර්මයන් අවසානයේ එම සාමාජිකයින්ගේ පවුල් වල පැන නැගී ඇති ප්‍රශ්ණ සහ ගැටළු (වැටුප්, වන්දි මුදල් සුභ සාධක කටයුතු සහ වෙනත් අවශ්‍යතාවයන්) සාකච්ඡා කිරීමේ අවස්ථාවක් ද ක්‍රියාවට නැංවීමට ද කටයුතු කර ඇති අතර, එසේ සාකච්ඡාවට ගැනෙන ප්‍රශ්න සහ ගැටළු සාකච්ඡා කර ඒ සඳහා නිසි විසඳුම් ලබාදීමටත්, උක්ත විසඳුම් ලබාදෙනු ලබන කාර්ය මණ්ඩලයට යම් විසඳුමක් ලබාදීමට නොහැකි ගැටළුවක් වේනෙත් එම ගැටළු අදල උසස් මූලස්ථානයන් වෙත යොමු කර විසඳුම් ලබාදීමට ක්‍රියා කරනු ලබන බව ද සනිටුහන් කර තබමි.

එසේම උක්ත කටයුතු සාර්ථකව කර ගැනීමේ අරමුණින් මෙන්ම මියගිය රණවිරුවන් සැම මොහොතකම අභිමානයෙන් යුතුව සිහිපත් කරනු ලබන බවත්, ඔවුන් වෙනුවෙන් නිරන්තරයෙන් ම උපරිම සේවයක් ඉටු කරනු ලබන බවත්, එම සාමාජිකයින්ගේ සිත් සතන් තුළ සනිටුහන් කිරීම පිණිස යුද්ධයේ දී මියගිය / අතුරුදහන් වූ අයවළුන් අතුරින් මධ්‍යම පළාතට අයත් රණවිරුවන්ගේ නාම ලේඛණය මෙම රෙජිමේන්තුව මගින් ත්‍රෛමාසිකව පළ කරනු ලබන වයිට් හැකල් සඟරාවේ පළ කරනු ලබනුයේ ඉමහත් සංවේගයෙනි.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| සෙ/285806 | ලාකෝ | රත්නායක | ආර්ඒආර් | 4ශ්‍රීලපාහ | පලෙයි | 00/04/11 |
| සෙ/9ඩී00625 | කෝප්‍රල් | විජේබංඩාර | පීඑම්එන්ආර් | 9(සේවී)ශ්‍රීලපාහ | අලිමංකඩ | 00/04/19 |
| සෙ/300018 | ලාකෝ | සේනාදීර | එස් | 6ශ්‍රීලපාහ | අලිමංකඩ | 00/04/22 |
| සෙ/305958 | ලාකෝ | ජයසේකර | එරේජ්එම්එන් | 6ශ්‍රීලපාහ | අලිමංකඩ | 00/04/22 |
| සෙ/306961 | ලාකෝ | ප්‍රියන්ත | ඩබ්පීඑම් | 6ශ්‍රීලපාහ | අලිමංකඩ | 00/04/22 |
| සෙ/311727 | සාසෙ | විජේකෝන් | ඩබ්එම්ආර්කේ | 6ශ්‍රීලපාහ | අලිමංකඩ | 00/04/22 |
| සෙ/302204 | සාසෙ | ධර්මරත්න | ඩීඑම් | 8ශ්‍රීලපාහ | අලිමංකඩ | 00/04/30 |
| සෙ/307968 | සාසෙ | නිශ්ශංක | ටජ්එන්එම්පීපී | 11ශ්‍රීලපාහ | අරියාලේ | 00/05/10 |
| සෙ/9ඩී01199 | සාසෙ | ආරියසිංහ | යූපී | 9(සේවී)ශ්‍රීලපාහ | යාපනය | 00/05/17 |
| සෙ/285863 | ලාකෝ | පියසේන | එන්පීඩබ්කේ | 3ශ්‍රීලපාහ | පලාලි | 01/04/00 |
| සෙ/314429 | සාසෙ | බංඩාර | රජ්එම්පීඑස් | 3ශ්‍රීලපාහ | පලෙයි | 01/04/25 |
| සෙ/301804 | ලාකෝ | පෙරේරා | ඩබ්ඩබ්ජීපී | 3ශ්‍රීලපාහ | කිලිනොච්චි | 01/10/96 |
| සෙ/306738 | ලාකෝ | දිසානායක | ඩීඑම්කේබී | 7ශ්‍රීලපාහ | පලාලි | 01/12/95 |
| සෙ/302167 | සැරයන් | සරත් ඒකනායක | ටකේපී | 12ශ්‍රීලපාහ | අලිමංකඩ | 02/04/00 |
| සෙ/22420 | ලාකෝ | විමලරත්න | ජීපී | 2(සේවී)ශ්‍රීලපාහ | වාකනේරි | 92/08/02 |
| සෙ/306953 | ලාකෝ | හේරත් | එච්එම් | 10ශ්‍රීලපාහ | විත්තන්ඩි | 96/08/02 |
| සෙ/301862 | සැරයන් | රණවීර | ආර්පීටීඩබ්ජ්ආර් | 4ශ්‍රීලපාහ | මාන්කුලම් | 96/08/02 |
| සෙ/307522 | ලාකෝ | ලියනගේ | එල්ජ්ආර් | 4ශ්‍රීලපාහ | මාන්කුලම් | 96/08/02 |
| සෙ/311673 | ලාකෝ | ජයතිස්ස | ආර්පීජ්ස් | 4ශ්‍රීලපාහ | මාන්කුලම් | 96/08/02 |
| සෙ/15114 | ලාකෝ | වික්‍රමරත්න | ජේම් | 3ශ්‍රීලපාහ | කඹුරුපිටිය | 96/09/02 |
| සෙ/303753 | ලාකෝ | රණවීර | ආර්පීජ්ජ්ස් | 3ශ්‍රීලපාහ | පරන්තන් | 96/10/02 |
| සෙ/00074 | වො/සැ | ගාමිණී ගුණසේන | කේපී | 9(සේවී)ශ්‍රීලපාහ | අලිමංකඩ | 00/01/03 |
| සෙ/67704 | ලාකෝ | බංඩාර | පීඩබ්ඩබ්ජී | 3ශ්‍රීලපාහ | කන්කසන්තුරේ | 92/08/03 |
| සෙ/306943 | සැරයන් | ධර්මසේන | ජීවීජී | 3ශ්‍රීලපාහ | චාවකච්චේරි | 00/09/03 |
| සෙ/302983 | ලාකෝ | උදයකුමාර | බීපීපී | 6ශ්‍රීලපාහ | චාවකච්චේරි | 00/09/03 |
| සෙ/3136 | ලාකෝ | රණසිංහ | ජීවීපීඑන් | 2(සේවී)ශ්‍රීලපාහ | ගල්කන්ද | 95/09/03 |
| සෙ/3145 | ලාකෝ | ටිටගසපොල | ආර්පීජ්පී | 2(සේවී)ශ්‍රීලපාහ | ගල්කන්ද | 95/09/03 |
| සෙ/305369 | ලාකෝ | ලියනගම | ජ්ජ්ල්ජ්ස්ආර් | 4ශ්‍රීලපාහ | අච්චුවෙලි | 95/10/03 |
| [illegible] | කෝප්‍රල් | ඒකනායක | රජ්ම් | 1ශ්‍රීලපාහ | දෙහිවත්ත | 85/12/03 |
| [illegible] | ලාකෝ | සුභරත්න | ඩීජ්ජේ | 1ශ්‍රීලපාහ | දෙහිවත්ත | 85/12/03 |
| සෙ/303472 | ලාකෝ | ජයරත්න | ජ්ම්ඩීජේ | 10ශ්‍රීලපාහ | කිලිනොච්චිය | 98/06/04 |
| සෙ/307003 | ලාකෝ | ජයසිංහ | ආර්කේජේජ්ස් | 10ශ්‍රීලපාහ | කිලිනොච්චිය | 98/06/04 |
| සෙ/308158 | කෝප්‍රල් | පොඩිමහත්තයා | ඩීජ්ම්ජ්ජ් | 7ශ්‍රීලපාහ | කිලිනොච්චි | 98/06/04 |
| සෙ/305797 | කෝප්‍රල් | බංඩාර | කේජ්ම්පීජ්ම්ජ්ම් | 4ශ්‍රීලපාහ | මාන්කුලම් | 98/07/04 |
| [illegible] | කපිතාන් | කේඩබ්ජ්ස් විතාරන | ශ්‍රීලපාහ | 5(සේවී)ශ්‍රීලපාහ | කොලොංමඩ | 98/08/04 |
| සෙ/307823 | ලාකෝ | ජයරත්න බංඩා | පීජ්ම් | 3ශ්‍රීලපාහ | අලිමංකඩ | 98/08/04 |
| [illegible] | කෝප්‍රල් | රත්නායක | ආර්ජ්ම්ජ්ම් | 2(සේවී)ශ්‍රීලපාහ | පුතානි | 98/09/04 |
| සෙ/9800452 | කෝප්‍රල් | හේරත් | ජ්වීපීජ්ම් | 9(සේවී)ශ්‍රීලපාහ | පලාලි | 98/09/04 |
| [illegible] | කෝප්‍රල් | අල්විර | ජ්ල්ජ්වී | 4ශ්‍රීලපාහ | වාකරේ | 92/06/05 |
| සෙ/307312 | ලාකෝ | වණසිංහ | පීපීජ්ම්ජ් | 10ශ්‍රීලපාහ | මාන්කුලම් | 98/06/05 |
| [illegible] | කෝප්‍රල් | තිලකරත්න බංඩා | පීපී | 6ශ්‍රීලපාහ | අලිමංකඩ | 91/08/05 |
| සෙ/302176 | ලාකෝ | හේරත් බංඩා | ඩීජ්ම්ර් | 3ශ්‍රීලපාහ | පලාලි | 92/08/05 |
| සෙ/305284 | ලාකෝ | ඒකනායක | රජ්ම්කේ | 1ශ්‍රීලපාහ | වවිනියාව | 97/03/06 |
| [illegible] | ලාකෝ | ජයවර්ධන | ඩීජ්ම් | 6ශ්‍රීලපාහ | වව්නියාව | 98/02/06 |
| සෙ/32 | ලාකෝ | විජේතුංග | කේපීඩී | 5(සේවී)ශ්‍රීලපාහ | තල්දුව | 89/07/06 |
| සෙ/15140 | ලාකෝ | මිල්ලව | ජ්ස්ජ්ස්ජ්ජ්ස්ජ්ල්ජ්ස් | 4ශ්‍රීලපාහ | මුලතිව් | 90/09/06 |
| සෙ/3845 | ලාකෝ | ගුණසිංහ | පීපී | 5(සේවී)ශ්‍රීලපාහ | මහින්දපුර | 92/09/06 |
| සෙ/3305 | ලාකෝ | සෝමරත්න | ආර්ජ්ම් | 5(සේවී)ශ්‍රීලපාහ | උලුක්කුලම් | 87/03/07 |
| සෙ/303517 | කෝප්‍රල් | තිලකරත්න | රඩීපීජ්ම්පී | 8ශ්‍රීලපාහ | මාන්කුලම් | 98/03/07 |
| සෙ/13569 | සැරයන් | ජයරත්න | පීපීජ්ස් | 4ශ්‍රීලපාහ | වාකරේ | 92/05/07 |
| සෙ/14878 | කෝප්‍රල් | එදිරිවීර | ජ්ල්ජ්ම් | 4ශ්‍රීලපාහ | වාකරේ | 92/05/07 |
| සෙ/304703 | ලාකෝ | උදයකුමාර | කේපීපී | 6ශ්‍රීලපාහ | මාන්කුලම් | 98/06/07 |
| සෙ/79449 | ලාකෝ | යටවර | ආර්ජ්ම්පීඩීජ්ම්ජ්පී | 6ශ්‍රීලපාහ | මාන්කුලම් | 98/06/07 |
| සෙ/14676 | ලාකෝ | විමලබංඩාර | යූජ්ස්ජ්ස් | 1ශ්‍රීලපාහ | යාපනය | 87/07/07 |
| සෙ/11303 | බනි | ජ්ජ්ම් ගුණරත්න | 0 | 7ශ්‍රීලපාහ | යුරෝකොළඹ | 99/08/08 |
| සෙ/14447 | ලාකෝ | සේනාරත්න | ඩබ්ජ්වීජ්ම්ජ්වී | 1ශ්‍රීලපාහ | මුලතිව් | 92/02/09 |
| සෙ/342 | ලාකෝ | අනිල් ගුප්ත | කේජ්ම් | 5(සේවී)ශ්‍රීලපාහ | සෙට්ටිකුලම් | 88/04/09 |
| සෙ/303672 | ලාකෝ | නිශාන්ත | ඩබ්ජ්ම්ජ්ස් | 8ශ්‍රීලපාහ | කයිතඩි | 00/06/09 |
| සෙ/14873 | ලාකෝ | ලාල් ආනන්ද | පීඩබ්පී | 4ශ්‍රීලපාහ | මුලතිව් | 90/06/09 |
| සෙ/97ජ්පී0326 | ලාකෝ | අනිල් කුමාර රණසිංහ | පීපී | 5(සේවී)ශ්‍රීලපාහ | මොරවැව | 97/08/09 |
| සෙ/312651 | ලාකෝ | නවාස් | ජ්ජ්ල් | 6ශ්‍රීලපාහ | චාවකච්චේරි | 00/09/09 |
| සි/4502 | කපිතාන් | ජ්ස්ජ්ම්ජ්ස් සමරකෝන් | ශ්‍රීලපාහ | 9(සේවී)ශ්‍රීලපාහ | චාවකච්චේරි | 00/09/09 |
| සෙ/300458 | ලාකෝ | වීරකෝන් | කේපීඩබ්ජ්ම්ජ් | 1ශ්‍රීලපාහ | මුලතිව් | 91/09/09 |
| සෙ/5ඩී00278 | වො/සැ | රත්නායක | වයිජ්ම් | 5(සේවී)ශ්‍රීලපාහ | පුල්මුඩේ | 98/01/10 |
| සෙ/307827 | කෝප්‍රල් | ආනන්ද | ඩීපීඩබ් | 3ශ්‍රීලපාහ | වව්නියාව | 98/02/10 |
| සෙ/12017 | බනි | ජ්න්ජ්ම්ජ් නවරත්න | 0 | 15ශ්‍රීලපාහ | අරියාලේ | 00/03/10 |
| සෙ/121503 | ලාකෝ | ජයම්පති | කේඩබ්ජ් | 15ශ්‍රීලපාහ | අරියාලේ | 00/03/10 |
| සෙ/ඊ01562 | ලාකෝ | නිව්ටන් ජයවීර | ජේ | 9(සේවී)ශ්‍රීලපාහ | කඩ්ඩුවාන් | 94/03/10 |
| සෙ/ඊ00190 | වො/සැ | සුගතදාස බංඩාර | ජ්ස්ජ් | 5(සේවී)ශ්‍රීලපාහ | කට්ටපරිච්චාන් | 92/04/10 |
| සෙ/00197 | සැරයන් | අතුරගුණරත්න | ජ්ම්ඩී | 5(සේවී)ශ්‍රීලපාහ | පවිතුර් | 92/04/10 |
| සෙ/00753 | ලාකෝ | ගුණසේකර | ජ්වීජ්ම් | 5(සේවී)ශ්‍රීලපාහ | පවිතුර් | 92/04/10 |
| සෙ/310206 | ලාකෝ | දිසානායක | ජ්ස්ඩීආර් | 11ශ්‍රීලපාහ | අරියාලේ | 00/05/10 |
| සෙ/12582 | බනි 11 | ගුණවර්ධන | පීකේජ්ස්ඩී | 10ශ්‍රීලපාහ | වව්නියාව | 97/06/10 |
| සෙ/303028 | සැරයන් | ජයරත්න | බීපී | 10ශ්‍රීලපාහ | වව්නියාව | 97/06/10 |
| සෙ/305140 | ලාකෝ | චන්ද්‍රකුමාර | ටජ් | 10ශ්‍රීලපාහ | වව්නියාව | 97/06/10 |
| සෙ/305916 | ලාකෝ | අමරසේන | ජේඩබ්පී | 10ශ්‍රීලපාහ | වව්නියාව | 97/06/10 |
| සෙ/306902 | ලාකෝ | නිමල් ඉන්ද්‍රරත්න | ජ්ම්පී | 10ශ්‍රීලපාහ | වව්නියාව | 97/06/10 |
| සෙ/306940 | සාසෙ | බංඩාර | ඩබ්පීජ්ල්ජ්ස් | 10ශ්‍රීලපාහ | වව්නියාව | 97/06/10 |
| සෙ/306941 | ලාකෝ | විජේසිංහ | කේපීපී | 10ශ්‍රීලපාහ | වව්නියාව | 97/06/10 |
| සෙ/306952 | ලාකෝ | මංචනායක | කේඩබ්පී | 10ශ්‍රීලපාහ | වව්නියාව | 97/06/10 |
| සෙ/306971 | ලාකෝ | මහින්ද රත්න | ආර්ට | 10ශ්‍රීලපාහ | වව්නියාව | 97/06/10 |
| සෙ/306976 | ලාකෝ | ප්‍රේමචන්ද්‍ර | ජ්ම්පීජ්ස් | 10ශ්‍රීලපාහ | වව්නියාව | 97/06/10 |
| සෙ/306979 | ලාකෝ | බංඩාරනායක | ඩීජ්ම්ජ්ස්ජ්ම් | 10ශ්‍රීලපාහ | වව්නියාව | 97/06/10 |
| සෙ/308498 | ලාකෝ | අතුර බංඩාර | ඩබ්ජ්ම් | 10ශ්‍රීලපාහ | වව්නියාව | 97/06/10 |
| සෙ/131941 | ලාකෝ | විමලසිරි | ජ්ල්පී | 6ශ්‍රීලපාහ | කෝරම්පත්තු | 00/07/10 |
| සෙ/15905 | වො/සැරයන් | නවරත්න බංඩා | ටජ් | 6ශ්‍රීලපාහ | කෝරම්පත්තු | 00/07/10 |
| සෙ/228503 | ලාකෝ | සමන්තකුමාර | පීඩබ්පී | 6ශ්‍රීලපාහ | යාපනය | 00/07/10 |
| සෙ/48281 | ලාකෝ | පියසේන | පීපීජ්න්කේ | 6ශ්‍රීලපාහ | අලිමංකඩ | 91/08/10 |
| සෙ/307187 | කෝප්‍රල් | චන්දන | ජ්පීජ්ස් | 4ශ්‍රීලපාහ | යාපනය | 00/09/10 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| සෙ/312685 | ලාකෝ | බංඩාර | ඊඑස්එච් | 4ශ්‍රීලපාහ | යාපනය | 00/09/10 |
| සෙ/ඊ00186 | ව/සැ | අශෝක රත්නායක | ආර්එම් | 5(සෙවි)ශ්‍රීලපාහ | පේරුවිල | 92/09/10 |
| සෙ/ඊ00376 | කෝප්‍රල් | සුනිල් වික්‍රමරත්න | එම්ආර්ආර් | 5(සෙවි)ශ්‍රීලපාහ | පේරුවිල | 92/09/10 |
| සෙ/ඊ00587 | ලාකෝ | ලයනල් බාලසූරිය | බීඑම්එස් | 5(සෙවි)ශ්‍රීලපාහ | පේරුවිල | 92/09/10 |
| සෙ/ඊ00639 | ලාකෝ | ලසන්ත රෝහිත | ආර්එම්එම් | 5(සෙවි)ශ්‍රීලපාහ | පේරුවිල | 92/09/10 |
| සෙ/ඊ00817 | ලාකෝ | ආනන්ද සරත් කුමාර | සේ | 5(සෙවි)ශ්‍රීලපාහ | පේරුවිල | 92/09/10 |
| සෙ/302596 | කෝප්‍රල් | බංඩාර | ආර්එම්එස් | 4ශ්‍රීලපාහ | පලාලි | 95/11/10 |
| සෙ/303667 | ලාකෝ | කරුණාතිලක | ටීපීඑම්කේ | 8ශ්‍රීලපාහ | පලාලි | 95/11/10 |
| සෙ/302436 | ව/සැ | බංඩාර | ආර්එම්ඩබ් | 15ශ්‍රීලපාහ | අරියාලේ | 00/03/11 |
| සෙ/285828 | ලාකෝ | හේරත් | එච්එම්ඩීකේ | 4ශ්‍රීලපාහ | පලෙයි | 00/04/11 |
| සෙ/303344 | ලාකෝ | සරත්කුමාර | එම් | 4ශ්‍රීලපාහ | පලෙයි | 00/04/11 |
| සෙ/285484 | සාසෙ | කරුණාරත්න | එච්ජීකේ | 8ශ්‍රීලපාහ | අලිමංකඩ | 00/04/11 |
| සෙ/12606 | සැරයන් | කපිල බංඩාර | එස්එම් | 6ශ්‍රීලපාහ | කල්මුණේ | 90/06/11 |
| සෙ/13149 | කෝප්‍රල් | ජයවර්ධන බංඩා | ඒජී | 6ශ්‍රීලපාහ | කල්මුණේ | 90/06/11 |
| සෙ/14458 | ලාකෝ | සමරකීර්ති | ඒජීආර්යූ | 6ශ්‍රීලපාහ | කල්මුණේ | 90/06/11 |
| සෙ/13142 | ලාකෝ | ජයරත්න | බීඑම්ජීජී | 1ශ්‍රීලපාහ | වාකරේ | 86/08/11 |
| සෙ/303750 | ලාකෝ | දසනායක | ඩීඑම් | 3ශ්‍රීලපාහ | වව්නියාව | 97/09/11 |
| සෙ/11526 | ඔහි 1 | අමරසිංහ | ටීජී | 1ශ්‍රීලපාහ | පුනරීන් | 93/11/11 |
| සෙ/305278 | ලාකෝ | දිසානායක | වයිබීඩීඑම්පීඑල් | 1ශ්‍රීලපාහ | පුනරීන් | 93/11/11 |
| සෙ/303687 | ලාකෝ | කරුණාරත්න | කේඑම්සීඩබ් | 1ශ්‍රීලපාහ | පුනරීන් | 93/11/11 |
| සෙ/300469 | ලාකෝ | කරුණාතිලක | බීඑම්ඩීඑස් | 1ශ්‍රීලපාහ | පුනරීන් | 93/11/11 |
| සෙ/302538 | කෝප්‍රල් | කොහොබලපිටිය | ඒජී | 1ශ්‍රීලපාහ | පුනරීන් | 93/11/11 |
| සෙ/302824 | ලාකෝ | ලක්මන් | පීඩබ්එම්එස් | 1ශ්‍රීලපාහ | පුනරීන් | 93/11/11 |
| සෙ/304137 | ලාකෝ | විජේසිංහ | බීඑම්පී | 1ශ්‍රීලපාහ | පුනරීන් | 93/11/11 |
| සෙ/302844 | ලාකෝ | සිරිවර්ධන | එස්කේ | 7ශ්‍රීලපාහ | පලාලි | 95/11/11 |
| සෙ/15222 | කෝප්‍රල් | ජයනන්දන | පීජීඑච් | 4ශ්‍රීලපාහ | යාපනය | 97/01/12 |
| සෙ/00136 | ලාකෝ | බංඩුල විජේසිංහ | එච් | 9(සෙවි)ශ්‍රීලපාහ | පුත්තූර් | 98/02/12 |
| සෙ/309175 | ලාකෝ | මාරසිංහ | එම්ජීඑස් | 7ශ්‍රීලපාහ | අලිමංකඩ | 97/07/12 |
| සෙ/5ඊ02000 | කෝප්‍රල් | ඒදිරිසිංහ | ඩීඩී | 5(සෙවි)ශ්‍රීලපාහ | ත්‍රී/මලය | 96/07/12 |
| සෙ/302456 | ව/සැ | විජේපාල | ඩබ්එම්එච් | 1ශ්‍රීලපාහ | මන්නාරම | 99/09/12 |
| සෙ/01091 | ලාකෝ | බංඩාර | ආර්එම්පී | 9(සෙවි)ශ්‍රීලපාහ | පුත්තූර් | 98/03/13 |
| සෙ/11699 | සැරයන් | කරුණාරත්න | එච් | 3ශ්‍රීලපාහ | මංකිරිව | 87/04/13 |
| සෙ/123150 | ලාකෝ | සිසිරකුමාර | ඩබ්එම් | 10ශ්‍රීලපාහ | වව්නියාව | 97/05/13 |
| සෙ/302781 | ලාකෝ | ඉලංගකෝන් | අයිඑම්ජේකේ | 1ශ්‍රීලපාහ | මාන්කුලම් | 98/06/13 |
| කි/63060 | කපිතාන් | කේජේකේඩීඑස් අරියරත්න | ශ්‍රීලපාහ | 1ශ්‍රීලපාහ | මාන්කුලම් | 98/06/13 |
| සෙ/12588 | ලාකෝ | නවරත්න | එම්ඩීබීඑන් | 1ශ්‍රීලපාහ | මාන්කුලම් | 98/06/13 |
| කි/63618 | ලුතිනන් | පීකේඩීයූ වලිසිංහ | ශ්‍රීලපාහ | 1ශ්‍රීලපාහ | මාන්කුලම් | 98/06/13 |
| සෙ/300254 | ව/සැ | හේවාතිලක | පීඑම්කේ | 7ශ්‍රීලපාහ | නගර්කෝවිල් | 00/07/13 |
| සෙ/15215 | සැරයන් | හරස්ගම | ඩීපීඩබ්එම්පීපී | 4ශ්‍රීලපාහ | මඩකලපුව | 01/07/13 |
| සෙ/307331 | ලාකෝ | රත්නායක | ආර්එම්එච්කේපීඑස්කේ | 10ශ්‍රීලපාහ | කදාන | 95/09/13 |
| සෙ/9ඊ00440 | කෝප්‍රල් | ආනන්ද රත්නවීර | එස්පී | 9(සෙවි)ශ්‍රීලපාහ | කදාන | 95/09/13 |
| සෙ/302263 | කෝප්‍රල් | හල්මෙ | එච්ජීකේජීකේ | 3ශ්‍රීලපාහ | වව්නියාව | 98/02/14 |
| සෙ/14ඊ00170 | ලාකෝ | රූපසිංහ | ආර්ඩී | 14(සෙවි)ශ්‍රීලපාහ | කයිට්ස් | 97/05/14 |
| සෙ/307017 | ලාකෝ | සේනවිරත්න | එච්එම් | 10ශ්‍රීලපාහ | පලාලි | 97/05/14 |
| සෙ/306173 | ලාකෝ | ජයසිංහ | එස්එම්එච්කේ | 7ශ්‍රීලපාහ | වෙත්තලඅඩි | 98/09/14 |
| සෙ/306894 | ලාකෝ | බංඩාර | කේඑම්පී | 10ශ්‍රීලපාහ | වව්නියාව | 97/05/15 |
| සෙ/306921 | ලාකෝ | සේනවිරත්න | ඩබ්පීපී | 10ශ්‍රීලපාහ | වව්නියාව | 97/05/15 |
| සෙ/308434 | ලාකෝ | විජේනායක බංඩා | එම්පීපී | 3ශ්‍රීලපාහ | වව්නියාව | 97/05/15 |
| සෙ/302890 | ලාකෝ | බංඩාර | එච්එම්කේපී | 3ශ්‍රීලපාහ | වව්නියාව | 97/05/15 |
| සෙ/14552 | ලාකෝ | ජයතිලක | ජේආර්එම්එන් | 3ශ්‍රීලපාහ | වව්නියාව | 91/06/15 |
| සෙ/44221 | ලාකෝ | කරුණාරත්න | ටීඑම්පීඑල් | 3ශ්‍රීලපාහ | වව්නියාව | 91/06/15 |
| සෙ/302898 | ලාකෝ | වන්නායක | බීඑම්එම්එස්කේ | 3ශ්‍රීලපාහ | තෙලිප්පලේ | 92/06/15 |
| සෙ/56076 | ලාකෝ | තිලකරත්න | ටීඑම් | 3ශ්‍රීලපාහ | අලිමංකඩ | 91/07/15 |
| සෙ/306516 | ලාකෝ | ගුණසිංහ | ටීජීඑන් | 10ශ්‍රීලපාහ | වව්නියාව | 97/09/15 |
| සෙ/308457 | ලාකෝ | තිලකසිරි | ඩීපීපී | 6ශ්‍රීලපාහ | වව්නියාව | 97/11/15 |
| සෙ/15075 | කෝප්‍රල් | බංඩාරනායක | බීඑම්බී | 3ශ්‍රීලපාහ | වැලිඔය | 91/09/16 |
| සෙ/300914 | සැරයන් | ගුණසේන | එස්එච් | 12ශ්‍රීලපාහ | වව්නියාව | 97/10/16 |
| සෙ/306937 | ලාකෝ | ගුණරත්නබංඩා | එම් | 4ශ්‍රීලපාහ | සරසාලේ | 00/12/16 |
| සෙ/325 | කෝප්‍රල් | වනිගසේකර | එන්ජේඑන් | 5(සෙවි)ශ්‍රීලපාහ | ඇටබගේකඩ | 89/01/17 |
| සෙ/15104 | කෝප්‍රල් | ලලිත් | ඩීපීපී | 6ශ්‍රීලපාහ | වැලිඔය | 92/03/17 |
| සෙ/14674 | සැරයන් | අබේසිංහ | ආර්එම් | 8ශ්‍රීලපාහ | මාන්කුලම් | 98/03/17 |
| සෙ/303444 | ලාකෝ | බංඩාර | ඩීඑස්ඩබ් | 3ශ්‍රීලපාහ | වව්නියාව | 97/05/17 |
| සෙ/5ඊ02362 | ලාකෝ | ඩික්සන් කුරේ | එම්ජේපීකේ | 5(සෙවි)ශ්‍රීලපාහ | මාන්කුලම් | 98/07/17 |
| කි/64523 | ලුතිනන් | එච්ඩබ්බී අතලවත්ත | ශ්‍රීලපාහ | 3ශ්‍රීලපාහ | චාවකච්චේරි | 00/09/17 |
| සෙ/285609 | ලාකෝ | රත්නායක | එච්පී | 3ශ්‍රීලපාහ | චාවකච්චේරි | 00/09/17 |
| සෙ/304123 | ලාකෝ | දිසානායක | ඩීඑම්පීකේ | 1ශ්‍රීලපාහ | පලාලි | 95/10/17 |
| සෙ/303043 | ලාකෝ | කරුණාරත්න | එස්එස්ඩබ්ලිව් | 1ශ්‍රීලපාහ | පලාලි | 95/10/17 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| සෙ/285683 | ලාකෝ | සිල්වා | ඩීඑච්සීආර්ඩී | 3ශ්‍රීලපාහ | වාසවිලාන් | 00/05/18 |
| සෙ/302471 | කෝප්‍රල් | ලලිත් | ඩීපී | 3ශ්‍රීලපාහ | වව්නියාව | 97/05/18 |
| සෙ/302009 | ලාකෝ | දයාවංශ | ඩීපීඩීපී | 7ශ්‍රීලපාහ | පරන්තන් | 99/07/18 |
| සෙ/12172 | ව/සැරයන් | කිවුල්දෙනිය | එච්එම්එන් | 3ශ්‍රීලපාහ | පලෙයි | 95/10/18 |
| සෙ/303920 | කෝප්‍රල් | අරුණසිරි | කේඩී | 3ශ්‍රීලපාහ | පලෙයි | 95/10/18 |
| සෙ/305449 | ලාකෝ | සමරසිංහ | එච්ඩීයූ | 4ශ්‍රීලපාහ | අලිමංකඩ | 99/12/18 |
| සෙ/308120 | ලාකෝ | සමන්ත බංඩාර | ඩබ්එච්එම් | 12ශ්‍රීලපාහ | අලිමංකඩ | 00/04/19 |
| සෙ/14698 | ලාකෝ | කුමාරසිංහ | ඩබ්පීඑම් | 1ශ්‍රීලපාහ | මන්නාරම | 91/04/19 |
| සෙ/11614 | සැරයන් | වීරගේ | ඩබ්එම්එම්එච් | 3ශ්‍රීලපාහ | දෙහිවත්ත | 86/09/19 |
| සෙ/15067 | ලාකෝ | හිමල්ශාන්ත | ටීජී | 3ශ්‍රීලපාහ | මහිලඩි | 90/10/19 |
| සෙ/306965 | කෝප්‍රල් | රාජරත්න | ආර්එන්පීඑස් | 10ශ්‍රීලපාහ | මඩු | 99/11/19 |
| සෙ/11360 | සැරයන් | මාවලගෙදර | එස්එම්බී | 3ශ්‍රීලපාහ | දෙහිවත්ත | 86/12/19 |
| සෙ/15094 | ලාකෝ | සමුවෙල් | පීඑම් | 3ශ්‍රීලපාහ | මැදවච්චිය | 88/12/19 |
| සෙ/304414 | සැරයන් | වනිගසූරිය | ඩබ්යූඑස් | 8ශ්‍රීලපාහ | අලිමංකඩ | 00/04/20 |
| කි/63737 | කපිතාන් | ටීඑම්එම්බී තෙන්නකෝන් | ශ්‍රීලපාහ | 3ශ්‍රීලපාහ | ව/බිලුමඩු | 98/04/20 |
| සෙ/314059 | ලාකෝ | විමලරත්න | පීපීඑස් | 3ශ්‍රීලපාහ | මුහමාලෙයි | 00/05/20 |
| සෙ/15091 | ලාකෝ | සකුලචන්ද්‍ර | ඩබ්එම්ඩබ් | 3ශ්‍රීලපාහ | පලාලි | 90/06/20 |
| සෙ/15123 | ලාකෝ | විජේවර්ධන | ඩබ්පීජේ | 3ශ්‍රීලපාහ | පලාලි | 90/06/20 |
| සෙ/308458 | ලාකෝ | කරුණාරත්න | යූඑම් | 6ශ්‍රීලපාහ | මාන්කුලම් | 98/06/20 |
| සෙ/13143 | කෝප්‍රල් | සේනාරත්න | ඩීඑම් | 1ශ්‍රීලපාහ | මන්නාරම | 01/07/20 |
| සෙ/125822 | ලාකෝ | විජේසූරිය | සීපීඑම් | 6ශ්‍රීලපාහ | වව්නියාව | 97/08/20 |
| සෙ/126095 | ලාකෝ | සකලසූරිය | එස්එම්එස්කේ | 6ශ්‍රීලපාහ | වව්නියාව | 97/08/20 |
| සෙ/302148 | සැරයන් | විජේසිංහ | ඩබ්පීඑස් | 3ශ්‍රීලපාහ | නගර්කෝවිල් | 00/10/20 |
| සෙ/9ඊ00249 | ලාකෝ | රණසිංහ | එම්එම්එස්කේකේ | 9(සෙවි)ශ්‍රීලපාහ | යාපනය | 96/06/21 |
| සෙ/307846 | ලාකෝ | කරුණාරත්න | පීඑම් | 4ශ්‍රීලපාහ | මාන්කුලම් | 98/07/21 |
| සෙ/22625 | ලාකෝ | කුමාරසිංහ | ඩබ්පී | 2(සෙවි)ශ්‍රීලපාහ | නායන්කේලි | 92/09/21 |
| සෙ/22631 | ලාකෝ | චන්ද්‍රරත්න | ඩීඑම් | 2(සෙවි)ශ්‍රීලපාහ | නායන්කර්නි | 92/09/21 |
| සෙ/14ඊ00265 | ලාකෝ | සුදත් වීරතුංග | අයිපීපීආර් | 14(සෙවි)ශ්‍රීලපාහ | පත්තන්තිලේපු | 99/12/21 |
| සෙ/305025 | සැරයන් | කරුණාරත්න | පීඩීජේඑම්එස් | 8ශ්‍රීලපාහ | යාපනය | 00/05/22 |
| සෙ/11451 | ලාකෝ | මහම්පිටිය | ඩීඑම්එච් | 1ශ්‍රීලපාහ | තිරුනෙල්වේලි | 83/07/22 |
| සෙ/11573 | ලාකෝ | සුනිල් | එම්ඩී | 1ශ්‍රීලපාහ | තිරුනෙල්වේලි | 83/07/22 |
| කි/61958 | මේජර් | එම්පීඑස්ජේ ගුණතිලක | ශ්‍රීලපාහ | 4ශ්‍රීලපාහ | වව්නියාව | 97/08/22 |
| සෙ/14900 | කෝප්‍රල් | රණසිංහ | පීපීඑම් | 4ශ්‍රීලපාහ | වව්නියාව | 97/08/22 |
| සෙ/114281 | ලාකෝ | කරුණාතිලක | ඩීටී | 7ශ්‍රීලපාහ | පරන්තන් | 96-09/22 |
| කි/61856 | මේජර් | ඩීඑන් මාසකෝරාළ | ශ්‍රීලපාහ | 7ශ්‍රීලපාහ | පලාලි | 95/10/22 |
| සෙ/306778 | ලාකෝ | විජේසිංහ | එච්බීකේ | 7ශ්‍රීලපාහ | පලාලි | 95/10/22 |
| සෙ/271883 | ලාකෝ | අරුණකුමාර | පීපීඑන් | 3ශ්‍රීලපාහ | නගර්කෝවිල් | 01/01/23 |
| සෙ/271885 | ලාකෝ | උදයරත්න | ඩබ්ඒ | 3ශ්‍රීලපාහ | නගර්කෝවිල් | 01/01/23 |
| සෙ/5ඊ00863 | ලාකෝ | කුසුම් වීරසිංහ | ඩබ්එම් | 5(සෙවි)ශ්‍රීලපාහ | මාන්කුලම් | 99/01/23 |
| කි/60356 | ලුතිනන් | එම්ටීඑම්සීටීබී මැදගොඩ | ශ්‍රීලපාහ | 3ශ්‍රීලපාහ | පලාලි | 90/06/23 |
| සෙ/306958 | ලාකෝ | ගුණරත්න බංඩා | එම් | 10ශ්‍රීලපාහ | වව්නියාව | 98/06/23 |
| සෙ/14506 | සැරයන් | කරුණාරත්න | ආර්පී | 6ශ්‍රීලපාහ | අලිමංකඩ | 91/07/23 |
| සෙ/41990 | ලාකෝ | විජේරත්න | එම්පීඩීටීපීඑල් | 6ශ්‍රීලපාහ | අලිමංකඩ | 91/07/23 |
| සෙ/302614 | ලාකෝ | විජේසුන්දර | එච්එල්එල්අයිඒ | 6ශ්‍රීලපාහ | මාන්කුලම් | 96/07/23 |
| සෙ/303590 | ලාකෝ | වසන්තකුමාර | පීපීආර් | 6ශ්‍රීලපාහ | මුලතිව් | 96/07/23 |
| සෙ/54679 | ලාකෝ | ප්‍රියන්ත | එල්ටී | 6ශ්‍රීලපාහ | වැලිඔය | 92/10/23 |
| සෙ/302571 | ලාකෝ | ප්‍රේමරත්න | ආර්සීබී | 6ශ්‍රීලපාහ | යාපනය | 00/12/23 |
| සෙ/15214 | ලාකෝ | අමරවංශ | යූපීඑස්යූකේ | 6ශ්‍රීලපාහ | පුනරීන් | 00/12/23 |
| සෙ/302994 | ලාකෝ | හේමන්ත | එම්සීජේ | 6ශ්‍රීලපාහ | වැලිඔය | 92/12/23 |
| සෙ/303019 | ලාකෝ | කරමද්ද | එම්එම්ජේඑල්යූ | 6ශ්‍රීලපාහ | වැලිඔය | 92/12/23 |
| සෙ/304351 | ලාකෝ | විමලසූරිය | එම්එස්පී | 6ශ්‍රීලපාහ | වැලිඔය | 92/12/23 |
| සෙ/68909 | ලාකෝ | විජේසූරිය | ටීඩබ්පීඑල් | 6ශ්‍රීලපාහ | වැලිඔය | 92/12/23 |
| සෙ/68374 | ලාකෝ | පියතිස්ස | පීපීඑස් | 6ශ්‍රීලපාහ | වැලිඔය | 92/12/23 |
| සෙ/63499 | ලාකෝ | තිලකරත්න | ඩීආර්පී | 6ශ්‍රීලපාහ | වව්නියාව | 92/02/24 |
| සෙ/129044 | ලාකෝ | හේරත් | එච්එම්පීඑම්පීපී | 4ශ්‍රීලපාහ | කන්කසන්තුරේ | 87/06/24 |
| සෙ/67690 | ලාකෝ | අබේරත්න බංඩා | කේඑම් | 3ශ්‍රීලපාහ | පලෙයි | 92/08/24 |
| සෙ/305432 | ලාකෝ | ගුණපාල | කේපීටී | 1ශ්‍රීලපාහ | මඩකලපුව | 99/09/24 |
| සෙ/57366 | ලාකෝ | විජේරත්න බංඩා | එච්ඒ | 3ශ්‍රීලපාහ | අලිමංකඩ | 92/03/25 |
| සෙ/5ඊ01878 | ලාකෝ | අලහකෝන් | එම් | 5(සෙවි)ශ්‍රීලපාහ | පුල්මුඩේ | 96/03/25 |
| සෙ/5ඊ01959 | ලාකෝ | දිසානායක | ඩීජී | 5(සෙවි)ශ්‍රීලපාහ | පුල්මුඩේ | 96/03/25 |
